# නියමුවා

ISSN 1391 - 1031 | 2025 පෙබරවාරි | 28 වෙළුම | 12 කලාපය | ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත | පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී | ආධාරය රු 100/=

# බෙදුණු යුගය අවසන්

මෙරට දේශපාලඥයින් ඉතිහාසය පුරා ජනතාවගේ විශ්වාසය කඩ කළ නමුත් බෙදීම වෙනුවට සියලුදෙනා එක්විය යුතු බවට පසුගිය මැතිවරණයේදී මේ රටේ ජනතාව තැබූ විශ්වාසය දැඩිව ආරක්ෂා කරන බවත් බෙදී සිටි යුගය අවසන් කළ යුතුව ඇති බවත් ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා පැවසීය. පසුගිය මැතිවරණවලදී විවිධ දේශපාලන වේදිකාවල සිටි අය අද එක්වී තමන් සිදු කළ වංචා සහ දූෂණවලට දඬුවම් ලැබීමෙන් බේරීමට සාකච්ඡා පවත්වන නමුත් මේ රටේ ජනතාව ආණ්ඩුව සමඟ සිටින තුරු ඔවුන්ගේ අරමුණු ඉටුකරගත නොහැකි බවද ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා අවධාරණය කළේය.

අනුර කුමාර දිසානායක සහෝදරයා මේ අදහස් පළ කර සිටියේ යාපනය, වැල්වැටිතුරේ ප්‍රදේශයේ පසුගිය 31 දින පැවති සුහද හමුව අමතමිනි.

දූෂිතයන්, හොරුන්ට සහ අපරාධකරුවන්ට නැවත මේ රටේ ඉඩක් නොතැබිය යුතු බවත් පසුගිය ජනාධිපතිවරණයේදී මේ රටේ ජනතාව අපේක්ෂා කළ යහපත් දේශපාලන සංස්කෘතිය රට තුළ ගොඩනැගීමේ වැඩපිළිවෙළ මතු පරපුර වෙනුවෙන් අත්නොහැර ශක්තිමත්ව ඉදිරියට ගෙන යන බවත් ප්‍රකාශ කළ ජනාධිපතිවරයා ජාතිවාදය සහ ආගම්වාදය යළිත් මේ රටට අවශ්‍ය නැති බවත් සියලු ජනතාව ජාතියක් ලෙස එක්වන දියුණු ශ්‍රී ලංකාවක් ගොඩනැගීම තම රජයේ අරමුණ බවද පෙන්වා දුන්නේය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

පසුගිය ජනාධිපතිවරණයේදී මේ යාපනයේ දිස්ත්‍රික්කයේ විශාල ජනතාවක් අප කෙරෙහි විශ්වාස තබා ඡන්දය ලබා දුන්නා. ඒ ඡන්දය ජාතික ජන බලවේගය ආණ්ඩුව හදන්න ශක්තියක් වුණා. හැබැයි ඊට වඩා ලොකුම ශක්තිය වන්නේ අපේ රටේ ජනතාව එකට එක් කිරීමට ඔබ සියලු දෙනා ඡන්දය ලබා දීමයි. උතුරේ, දකුණේ, නැගෙනහිර, කඳුකරයේ සියලු ජනතාවගේ විශ්වාසය දිනාගත් ආණ්ඩුවක් ලංකාවේ පළමු වතාවට නිර්මාණය වුණා. දශක ගණනාවක් තිස්සේ අප රටේ මොන වගේ දේශපාලනයක්ද තිබුණේ? උතුරේ වෙනම දේශපාලනයක්, දකුණේ වෙනම දේශපාලනයක්, නැගෙනහිර සහ කඳුකරයේ වෙනම දේශපාලනයක් වශයෙන් බෙදී තිබුණා. අපේ රටේ පැරණි දේශපාලනඥයන් රටේ ජනතාව බෙදන දේශපාලනයක නිරත වුණා. එම බෙදීම යුද්ධයක් ඇති වන තුරු සිදු වුණා. ඒ නිසා අපේ පරම්පරාව යුද්ධ කරගත්තා. අපේ පරම්පරාව අවිශ්වාසය, සැකය, ක්‍රෝධය වපුරමින් ජීවත් වුණා. අපිට තවත් බෙදෙන්න අවශ්‍ය නැහැ. ජනතාව බෙදෙන එක නවත්වා ජනතාව එකට එක්වන දේශපාලනයක් වෙනුවෙන් ලංකාවේ පළමු වතාවට ආණ්ඩුවක් හැදුණා.

දැන් තිබෙන්නේ බෙදීම් අවසන් කළ, එකතු කරපු ආණ්ඩුවක්. ඒ නිසා තමයි අපි වැල්වැටිතුරේ ප්‍රදේශයට පැමිණ දහස් ගණන් අම්මලා, තාත්තලා, සහෝදර සහෝදරියන් මුණ ගැසෙන්නේ. මේ ශක්තිය, මේ එකතුවීම අපි යළි වෙන් කිරීමට ඉඩ දිය යුතු නැහැ. අපි සියලුදෙනා එක්විය යුතුයි.

## ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා

අපි මෙවර අයවැය ලේඛනයට අලුත් යෝජනාවක් ඇතුළත් කරනවා. සිංහල, දෙමළ, මුස්ලිම්, බෞද්ධ, හින්දු, කතෝලික, ඉස්ලාම් අපි සියලුදෙනා එකතුවෙලා සමරන දිනයක් අපට ඕනෑ. ඔක්තෝබර් මාසයේ මේ සියලු ජන ප්‍රජාවන්ගේ සංස්කෘතීන්, ආහාර රටා, ජීවන රටා, විලාසිතා, සංගීත, නාට්‍ය මේ සියල්ල එකට එක් කර ජාතියේ මහා මංගල්‍යය සැමරීමට අපි සැලසුම් කර තිබෙනවා. අපි ඈත් වෙලා හිටියට අපේ දරුවන්ට ඈත් වෙන්න දෙන්න හොඳ නැහැ. උතුර, නැගෙනහිර, දකුණ සියලු දරුවන් එකට එක්වන රාජ්‍යයක් බවට අපි මේ රාජ්‍යය පත් කරනවා.

අපිට ගහගෙන මරාගෙන, ඇණ කොටාගෙන රටක් ලෙස ඉදිරියට යන්න බැහැ. අපේ රට ඉදිරියට යන්නේ අපි අතර සමගිය ගොඩනැගුණොත් පමණයි. ඒ නිසා අපේ ආණ්ඩුව සමගිය ගොඩනැගීමට විශාල වෙහෙසක් දරනවා. එම සමගිය ඇති කිරීම සඳහා හොඳම ධෛර්ය ලබා දුන්නේ ඔබයි. පාරම්පරික දේශපාලනඥයෝ වෙනම රටක් අරන් දෙන්නම් කියලා ඡන්දය ඉල්ලුවා. හැබැයි ජනතාව ඔවුන් ප්‍රතික්ෂේප කරලා යාපනය දිස්ත්‍රික්කය තුළ අපට ජයග්‍රහණය ලබා දුන්නා. ජනතාව කැමතියි එකතු වෙන්න. ජනතාව ළඟ ජාතිවාදය, ආගම්වාදය නැහැ. හැබැයි උතුරේත්, දකුණේත් දේශපාලනඥයන්ගේ පැවැත්ම වුණේ ජාතිවාදයයි. නැවත නැවත එය දකුණේ හිස එසවීමට උත්සහ කරනවා. නමුත් අපට ජාතික සමගිය අවශ්‍යයි. අපි හදලා තියන ආණ්ඩුව ජනතාවගේ ආණ්ඩුවක්. අපි මේ රට වෙනස් කරමු. අලුත් යුගයකට ගෙන යමු.



## 03 ජනවරමේ වැදගත්ම...

ඡන්ද දෙකේදීම පැරදුණු දූෂිත කණ්ඩායම් රටේ නව දේශපාලන සංස්කෘතියක් ගොඩනඟන්න දරන ප්‍රයත්නයට විරුද්ධ වෙමින් තාවකාලික දේශපාලන වාසියක් ලබා තිබෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට එරෙහිව...



## 05 බංකොලොත් විවේචකයෝ...

'මාලිමාව ආණ්ඩුව' කරගෙන යාමට නොහැකි වනු ඇතැයිද එය ඉක්මනින් අර්බුදයට යනු ඇතැයිද මොවුන් සමහර විට ඇත්තටම හිතන්නට ඇත. මැතිවරණ සමයේ ඔවුන් විසින් රටට එසේ ප්‍රකාශ කරනු ලැබීය. එහෙත් දැන් ආණ්ඩුව...



## 09 ශිෂ්ටාචාරයට මුහුණුවරක්...

දෙවියන් විසින් ලෝකයේ බලය-ආධිපත්‍යය දැරූ සමයේ යහපත හා අයහපත දෙස බලා සිටියේ දෙවියන්ය. දැන් අප බුද්ධිවාදය තුළ දෙවියන් මරා දමා ඇත. එවන් පසුබිමක, ඉහළ සිට බලා සිටින්නට දෙවියෙක්...




තරුණ................................ 04
ජාත්‍යන්තර......................... 06
ආර්ථිකය ........................... 07
කාන්තා................................ 08
විශේෂාංග.......................... 10
වේදිකාව.............................. 11


යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!

# ජනාධිපති හා වෘත්තීය සමිති නියෝජිතයින් අතර හමුවක්



ආණ්ඩුවේ ඉදිරි දැක්ම හා වෘත්තීය සමිති කාර්යභාරය පිළිබඳව ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයා හා වෘත්තීය සමිති අතර හමුවක් පසුගිය 29 දින කොළඹදී පැවැත්විණි. මේ සඳහා රාජ්‍ය, අර්ධ රාජ්‍ය, පෞද්ගලික, වතු ක්ෂේත්‍ර නියෝජනය කරමින් විශාල පිරිසක් සහභාගි වූහ. මෙම අවස්ථාවට ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ සභාපති, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, පශු සම්පත් ඇමති ලාල්කාන්ත, ජාතික වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේකම් පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දන සූරියආරච්චි, අන්තර් සමාගම් සේවක සංගමයේ ප්‍රධාන ලේකම් ජානක අධිකාරී, වෙළඳ කලාප සේවකයින්ගේ ජාතික මධ්‍යස්ථානයේ කැඳවුම්කරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගාමිණී රත්නායක, ලංකා ගුරුසේවා සංගමයේ සභාපති ධම්මික අලහප්පෙරුම, සමස්ත ලංකා වරාය පොදු සේවක සමිතියේ ලේකම් නිරෝෂන් ගොරකානගේ, සමස්ත ලංකා ප්‍රවාහන සේවක සංගමයේ ලේකම් සේපාල ලියනගේ, සමස්ත ලංකා දුම්රිය සේවකයින්ගේ පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතානගේ, සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් එස්.බී. මැදිවත්ත ඇතුළු වෘත්තීය සමිති නායකයෝ එක්ව සිටියහ.

# නියෝජ්‍ය ඇමති රත්මලාන දුම්රිය අංගනයේ නිරීක්ෂණ චාරිකාවක



ප්‍රවාහන මහාමාර්ග වරාය හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍ය ප්‍රසන්න කුමාර ගුණසේන මහතා පසුගියදා රත්මලාන දුම්රිය වැඩබිමේ නිරීක්ෂණ චාරිකාවක යෙදුණු අතර මෙම අවස්ථාවට දුම්රිය සාමාන්‍යාධිකාරී, ප්‍රධාන යාන්ත්‍රික ඉංජිනේරු ඇතුළු නිලධාරීහුද සමස්ත ලංකා දුම්රිය පොදු සේවක සංගමයේ ප්‍රධාන ලේකම් එස්.පී. විතානගේ, දුම්රිය තාක්ෂණ ශිල්පී සංගමයේ ලේකම් එම්.ඒ. රත්නසිරි ඇතුළු වෘත්තීය සමිති නායකයෝද සම්බන්ධ වූහ. මෙහිදී දුම්රිය සේවය ගොඩනැගීමට අදාළ පියවර රැසක් නියෝජ්‍ය අමාත්‍යවරයාගේ අවධානයට ලක් වූ අතර ඉදිරියේදී දුම්රිය සේවකයින්ට තෘප්තිමත් ලෙස සේවය පවත්වාගැනීමටත්, දුම්රිය ජනතාවට වඩා පහසු හා දියුණු සේවාවක් බවට පත් කර ගැනීමටත් අවශ්‍ය නව වැඩපිළිවෙළක් ඉතා නුදුරේම ඉදිරිපත් කරන බව නියෝජ්‍ය අමාත්‍යවරයා මෙහිදී පැවසීය.

# බොරු මත එපා... සංවර්ධන නිලධාරී ගැටලු විසඳීමට පියවර රැසක්...

### පාර්ලිමේන්තු මන්ත්‍රී චන්දන සූරියආරච්චි



සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් මෙතක් පැවැති ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා වැඩපිළිවෙළක් ආරම්භ කර තිබෙන බවත් එවන් තත්වයක් තුළ යම් වෘත්තීය සමිතියක් වැරදි අදහසක් සමාජගත කර ඇති බවත් චන්දන සූරියආරච්චි සහෝදරයා පවසයි. රාජ්‍ය සහ පළාත් රාජ්‍ය යන සේවාවන් දෙකෙහිම සංවර්ධන නිලධාරීන් සිටින බවත් මේ දෙපිරිසම එකම ප්‍රශ්න ගොඩක සිටින බවද මාස 2ක් වැනි කෙටි කාලයක් තුළ සංවර්ධන නිලධාරීන් සම්බන්ධයෙන් වැඩපිළිවෙළක් ආණ්ඩුව විසින් ආරම්භ කර තිබෙන බවද මෙහිදී චන්දන සූරියආරච්චි සහෝදරයා පැවසීය.

දෙසැම්බර් 2දා අමාත්‍ය මණ්ඩලය කමිටුවක් පත් කළ බවත් සංවර්ධන නිලධාරීන්ගේ ගැටලු විසඳීමට අමාත්‍ය මණ්ඩලයේදී සාකච්ඡා කර තිබුණ බවද එක්තරා වෘත්තීය සමිතියක් බොරු සමාජ ගත කර ඇති බවත් පටු සැඟවුණු දේශපාලන කාරණා වෙනුවෙන් ඇත්ත සමාජගත නොකර වැරදි දේ සමාජ ගත කරනවා නම් එය වැරදි බවත් චන්දන සූරියආරච්චි සහෝදරයා මෙහිදී අවධාරණය කළේය.

රජය වෘත්තීය සමිතිවලට සවන් නොදෙන බවට කීමට ඇතැමුන් උත්සාහ කරන නමුත් එය අසත්‍යයක් වන බවද එළඹෙන 11දාත් මේ සම්බන්ධයෙන් සාකච්ඡා 5ක් යොදාගෙන තිබෙන බවද මෙහිදී ඔහු අවධාරණය කළේය. මෙම අවස්ථාව සඳහා සංවර්ධන නිලධාරී සේවා සංගමයේ වෘත්තීය සමිති නිලධාරීහු රැසක් සහභාගි වූහ.

# සෞඛ්‍ය සේවා නිලධාරීන් නව ජනවරම තේරුම් ගත යුතුයි

### සමස්ත ලංකා හෙද සංගමයේ සභාපති රවීන්ද්‍ර කහඳවආරච්චි



පසුගිය කාලවකවනුවේ එක එක ආණ්ඩුවලින් පත්වීම් ගත් හා එම ආණ්ඩුවලට අවශ්‍ය ලෙස හැසුරුණු සෞඛ්‍ය සේවාවේ නිලධාරීන් සහ ඇතැම් වෘත්තීය සමිති නායකයින් වර්තමානයේ ශ්‍රේණි අතර ගැටුම් නිර්මාණය කරමින් වර්ජන නිර්මාණය කිරීමට උත්සාහ දරන්නේ නම් එයට ඉඩ දීමට තම සංගමය සූදානම් නොවන බවත් ඔවුන් සියලු දෙනා ආණ්ඩුවට ලබා දී ඇති ජනවරම තේරුම් ගත යුතුව ඇති බවත් සමස්ත ලංකා හෙද සංගමයේ සභාපති රවීන්ද්‍ර කහඳවආරච්චි සහෝදරයා පසුගියදා මාධ්‍ය හමුවක් අමතමින් පැවසීය.

සෞඛ්‍ය සේවය පද්ධතියක් ලෙස සංවර්ධනයක් විය යුතු බවත් සෞඛ්‍ය සේවාව Clean කිරීමේදී එක පද්ධතියක් ලෙස සිදුවිය යුතු බවත් එක හා සමානව ඉහළට එසවිය යුතු නමුත් උසස්වීම් හා ශ්‍රේණි අතර ගැටුමක් ඇති වීමේදී සිදුවන්නේ සෞඛ්‍ය සේවාවේ බිඳ වැටීම බවත් ඔහු අවධාරණය කළේය. ජනතාවත් සෞඛ්‍ය සේවකයාත්, ආණ්ඩුවත් එක මාර්ගයක යද්දී එයට එරෙහිව කකුලෙන් ඇදීමට හදන මෙම නිලධාරීන්, වෘත්තීය සමිති නායකයින් සහ ඔවුන්ගේ බාධාවන් පිළිබඳව ජනතාවට හෙළිදරව් කරන බවත් මෙහිදී රවීන්ද්‍ර සහෝදරයා පැවසීය. මෙම මාධ්‍ය හමුව සඳහා සමස්ත ලංකා හෙද සංගමයේ ලේකම් එස්.බී. මැදිවත්ත, භාණ්ඩාගාරික ආර්.පී.එම්. පුබුදුනී යන සහෝදර සහෝදරියෝ එක්ව සිටියහ.

# වැඩිම අවධානය දරුවන්ගේ අධ්‍යාපනයට

පාසල් හා පිරිවෙන් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් මෙම වසරේදී ප්‍රදානයන් රැසක් ලබාදීමට මාසයක් තුළ අවස්ථා දෙකකදී කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාදී ඇත.

ජනවාරි 06වැනි දින රැස්වූ කැබිනට් මණ්ඩලය අස්වැසුම සහනාධාරය ලබන පවුල්වල දරුවන්ට අමතරව අස්වැසුම නොලබන, සුදුසුකම් ලත් අනෙකුත් පවුල්වල දරුවන්ටද ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් රුපියල් 6000 බැගින් ගෙවීමට අනුමැතිය ලබා දුන්නේය. මේ යටතේ 300ට අඩු ශිෂ්‍ය පිරිසක් සිටින පාසල් 6576ක අස්වැසුම ප්‍රතිලාභ නොලබන පවුල්වල සියලු දරුවන්ට මෙන්ම ළමා සංවර්ධන මධ්‍යස්ථානවල සිට පැමිණෙන දරුවන්ට සහ පිරිවෙන්වල ඉගෙනුම ලබන ගිහි පැවිදි දෙපාර්ශ්වයේම සිසුන් හට රුපියල් 6000ක ලිපි ද්‍රව්‍ය දීමනා ලබාදීමට අනුමැතිය හිමිව තිබේ.

ඊට අමතරව ජනවාරි 20වැනි දින රැස්වූ කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද සංදේශයක් අනුව තෝරා ගත් පාසල් සහ පිරිවෙන්වල ගිහි පැවිදි දෙපාර්ශ්වයේම සිසු සිසුවියන් හට රුපියල් 3000ක පාවහන් තිළිණපත් ලබා දීමට අනුමැතිය ලබාදී තිබේ. ඒ අනුව පාසල් සිසු සිසුවියන් 79,000කට, පිරිවෙන්වල ඉගෙනුම ලබන සිසු සිසුවියන් 30,000කට මෙන්ම විශේෂ අවස්ථා සහිත පාසල් 28ක සිසු සිසුවියන් 2300කට මෙම පාවහන් තිළිණපත් ප්‍රදානය කෙරේ. ඊට අමතරව පාසල් දරුවන්ගේ පෝෂණ තත්වය නංවාලීම සඳහා රජයේ පාසල්වල 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන සිසු දරුවන් වෙනුවෙන් දිවා ආහාර ලබාදීමට අනුමැතිය ලබාදී ඇති අතර, ඒ අනුව මුළු සිසු දරු දැරියන් ලක්ෂ 15කට දිවා ආහාරය හිමි වේ.

# ආර්ථික පිම්මට වරායෙන් ගැම්මක්...

කොළඹ වරාය පුළුල් කිරීමේ දෙවන අදියර යටතේ බටහිර පර්යන්තය සඳහා දිය කඩනය දීර්ඝ කිරීමට අදාළව තාක්ෂණික සහ මූල්‍ය සහාය ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා දෙන ආධාර යටතේ කඩිනම් කිරීමට පියවර ගෙන ඇත.

ජාතික ජන බලවේගයේ ආණ්ඩුව බලයට පත්වීමට පෙර මෙම කොන්ත්‍රාත්තුව පවරාදීම සඳහා ටෙන්ඩර් පත් කැඳවා තිබූ අතර, 20දෙනෙකු ඒ සඳහා ඉදිරිපත් වී තිබිණ. එයින් තෝරා ගත් ආයතන තුනක් තාක්ෂණික පිරිවිතර සම්පූර්ණ කිරීම අනුව මූල්‍ය යෝජනා ඇගයීමට ලක්කර ඇත. එම සමාගම් අතරින් උපදේශක සේවා සැපයීම ෘදයඅ ැබටසබබැරසබට සමාගමට පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී ඇත. උපදේශක ප්‍රසම්පාදක කමිටුවේ නිර්දේශ අනුව එම අනුමැතිය ලබාදී ඇති අතර, අදාල කොන්ත්‍රාත්තුව පිරිනැමීමට කටයුතු සූදානම් කෙරෙමින් පවතී.

# ධීවර සවියට සහන රැසක්

ධීවර කාර්මිකයන් සඳහා හදිසි මානුෂීය ආධාර සැපයීමට චීන මහජන සමූහාණ්ඩුව ඉදිරිපත් වී සිටින අතර, ඒ වෙනුවෙන් යුවාන් මිලියන 35.7ක් වැය වන ව්‍යාපෘතියට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාදී තිබේ.

විශේෂයෙන්ම උතුර සහ නැගෙනහිර පළාත්වල කුඩා පරිමාණ ධීවර කාර්මිකයන් සඳහා සහල්, ධීවර ආම්පන්න සහ පෙර සැකසුම් නිවාස ලබාදීම වෙනුවෙන් මෙම මුදල් වැය කිරීමට නියමිතය. මේ යටතේ කුඩා පරිමාණ අඩු ආදායම් ලාභී ධීවරයන් සඳහා දැල් 75,000ක් ලබාදීමටත් එම ධීවර පවුල් වෙනුවෙන් සහල් මෙට්‍රික් ටොන් 1630ක් ලබාදීමටත් නියමිතය. එමෙන්ම මෙම ධීවර පවුල් 500ක් සඳහා පෙර සකසන ලද නිවාස ලබාදීමට සැලසුම් කර තිබේ.

මෙම හදිසි ආධාර ලබාදීම වෙනුවෙන් චීන මහජන සමූහාණ්ඩුව සහ ශ්‍රී ලංකා රජය අතර ගිවිසුම අත්සන් කිරීම සඳහා ධීවර ජලජ සහ සාගර සම්පත් අමාත්‍යවරයා ඉදිරිපත් කළ සංදේශයට කැබිනට් අනුමැතිය ලබාදෙන ලදී.

# පළාත් පාලන ආයතනවල මහජන සේවා උපරිම කිරීමට සැලසුම්

පසුගිය ආණ්ඩුව සමයේ ප්‍රමිතියෙන් තොර ඖෂධ ලබාදීම නිසා අක්ෂි ආබාධවලට ලක්වූ සහ අඳභාවයට ලක්වූ අය වෙනුවෙන් වන්දි ගෙවීම සඳහා සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යවරයා ඉදිරිපත් කරන ලද කැබිනට් සංදේශයට අනුමැතිය ලබාදී තිබේ.

ඒ අනුව රෝගී වී සිටි 17දෙනෙකු වෙනුවෙන් වන්දි මුදල් කඩිනමින් ලබාදීමට කටයුතු කර ඇත. රෝගීන් 12දෙනෙකුගෙන් රුපියල් ලක්ෂ 10 බැගින්ද, තවත් රෝගීන් දෙදෙනෙකු වෙනුවෙන් රුපියල් හත්ලක්ෂ පනස්දහස බැගින්ද, තවත් රෝගියෙක් වෙනුවෙන් රුපියල් ලක්ෂ හතක්ද ඉතිරි දෙදෙනා වෙනුවෙන් රුපියල් දෙලක්ෂ පනස්දහස බැගින්ද වන්දි ලබාදීමට අනුමැතිය ලබාදී ඇත.

නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහලේ අක්ෂි ශල්‍යකර්මවලට භාජනය වූ මෙම වින්දිතයන් සඳහා ගෙවිය යුතු වන්දි ප්‍රමාණය තීරණය කිරීම පිණිස තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කිරීමට 2024 පෙබරවාරි 12වැනි දින කැබිනට් අනුමැතිය ලබාදී තිබිණි. වසරකට වැඩි කාලයක් ප්‍රමාදවී තිබූ එම වන්දි මුදල් කඩිනමින් ගෙවීමට ජාතික ජන බලවේගයේ ආණ්ඩුව විසින් තීරණය කර තිබේ.

# රාජ්‍ය සේවයේ ක්‍රියාත්මක වන නීති රීති සහ රෙගුලාසි වත්මන් යුගයට ගැලපෙන පරිදි යාවත්කාලීන කෙරේ

වත්මන් රාජ්‍ය සේවා අවශ්‍යතාවන්ට ගැලපෙන පරිදි මහජන අවශ්‍යතාවන් කාර්යක්ෂමව ඉටුකිරීමට හැකිවන පරිදි දැනට බලාත්මක නීති රීති, රෙගුලාසි සහ කාර්යපටිපාටීන් යාවත්කාලීන කිරීමට නිලධාරීන්ගෙන් සහ මහජනතාවගෙන් අදහස් සහ යෝජනා ලබාගෙන වාර්තාවක් සැකසීමට අනුමැතිය හිමි විය.

# දිළිඳුකම පිටුදැකීම වෙනුවෙන් ග්‍රාමීය සංවර්ධන වැඩසටහනක්

ග්‍රාමීය ව්‍යවසාය හා ජීවනෝපාය සංවර්ධනය, යටිතල පහසුකම් සංවර්ධනය හා ධාරිතා සංවර්ධනය මගින් ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමේ අරමුණින් පෙර පැවති සෞභාග්‍යා සංවර්ධන කාර්යංශය ප්‍රතිව්‍යුහගතකරණය කර, 'ග්‍රාමීය සංවර්ධන කාර්යංශය' ලෙස නම් කිරීමට අනුමැතිය හිමි විය.

නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# "නිදහස" සංකල්පයක සිට යථාර්ථය දක්වා

ලංකාවේ නිල නිදහස් දිනය මෙම පෙබරවාරි 4දාට යෙදී තිබේ. මෙය සැලකෙන්නේ 77 වන නිදහස් දිනය ලෙසය. ඒ අනුව වත්මන් පාලනයටද සරලව හෝ නිදහස් උත්සවයක් තැබීමට සිදුවේ. ඒ, මෙය සම්ප්‍රදායක් ලෙස පැවත එන නිසාය.

අප කවුරුත් දන්නා පරිදි ලංකාවට 1948 දී පූර්ණ 'නිදහස' ලැබුණේ නැත. ලංකාවට ලැබුනේ බාග නිදහසකි. නැතිනම් "දිගේලි කරන ලද" නිදහසකි. ලංකාව බ්‍රිතාන්‍යයෙන් සම්පූර්ණයෙන් නිදහස් වූයේ 1972 ජනරජ ව්‍යවස්ථාව සම්මත කිරීමත් සමගය. එසේ වුවද ලංකාවටත් එහි ජනතාවටත් 'නිදහස' නමැති පුළුල් අර්ථයෙන් තවම 'නිදහස' නැත. සත්‍යය එයයි.

ලංකාව ආර්ථික වශයෙන් නිදහස්ද? නැත. පසුගිය කාලයේ රට පාලනය කළ සියලු ආණ්ඩු විශේෂයෙන් 1977න් පසු පත්වූ පාලකයන් ලංකාව ආර්ථික වශයෙන් අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික න්‍යාය පත්‍රවලට අනුව ලංකාවේ ආර්ථිකය හැසිරවූහ. එක් අතකින් විවිධ අවාසිදායක ආර්ථික ගිවිසුම් මගින්ද අනෙක් අතින් විශාල වශයෙන් විදේශ ණය ලබාගෙන, ණය නිසා විදේශවලට යට වීමට සිදුවීම මගින්ද රටේ ආර්ථිකය පරාධීන කරනු ලැබ තිබුණි.

මේ මොහොතේද ලංකාවේ ආර්ථිකය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගැට ගසා එහි ස්වාධීනත්වය බිඳ දමනු ලැබ තිබේ. ඒ, රනිල් - මහින්ද පාලනය විසිනි.

ලංකාවේ ආර්ථිකය බංකොලොත් බවින් මෙන්ම විදේශ බලවතුන්ට යට කිරීමේ උගුලින් මුදාගෙන අපේම උපායමාර්ගයකට අනුව ආර්ථික සංවර්ධනය මෙන්ම ආර්ථික නිදහසද දිනා ගැනීම සඳහා වැඩ ආරම්භ කර තිබේ. ඒ, වත්මන් පාලනය යටතේය. ආර්ථික ස්වාධීනත්වය නැති තැනක රට සැබෑ ලෙසම නිදහස් වන්නේ නැත. ආර්ථිකයේ ස්වාධීනත්වය අත්පත් කර ගත යුත්තේ ඒ නිසාය.

අනෙක් අතට ලංකාව පරිපාලනමය වශයෙන් මෙන්ම සමහර නීතිවලින්ද වර්තමානයන්ට ගැලපෙන ලෙස වෙනස් වී 'නිදහස්' වී නැත. ලංකාවේ පරිපාලන ව්‍යුහය තුළ තවමත් බ්‍රිතාන්‍යයෙන් උරුම වුණු පැරණි දේවල් දැකිය හැක. සමහර නීති රීතිද වර්තමානයට නොගැලපෙන බව පෙනේ. ඒවාද වර්තමාන සමාජයට අනුව වෙනස් විය යුතුය; ස්වාධීන විය යුතුය. වත්මන් පාලනය ඉදිරියේ ඇති එක් වගකීමක් වන්නේද එයයි.

අනෙක් අතට ලංකාවේ ජනතාවගේ පොදු ජන විඥානයද හොඳින්ම 'නිදහස්' නැත. අතීතයේදී මෙරට ජනයා බ්‍රිතාන්‍ය කිරීටයට ගරු කරන, විදේශික දේ ඉහළින් අගයන මනෝභාවයක සිටි බව අපි දනිමු. පසු කලෙක මේවා වෙනස් වුවද පොදු ජන විඥානය මුළුමනින්ම 'නිදහස්ව' නැත.

පසුගිය වසර 50කට ආසන්න කාලයක් මෙරට පවත්වාගෙන ගිය නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තියට අනුව ජනතාව හිතන ආකාරයද හැඩ ගැසී තිබේ. එය එක් එක් පුද්ගලයාගේ වරදක් නොව පැවැති ක්‍රමයේ තර්කානුකූල ප්‍රතිඵලය වේ. පසුගිය අර්බුද සමයේ බොහෝ දෙනාගේ සිහිනය වූයේ ලංකාව අතහැර වෙනත් රටකට යාමය. හැකියාව තිබූ සමහරු එසේ ගිය බවද සත්‍යයකි. රට තමන්ගේ යන හැඟීම හෝ තමන් නිදහස් ජාතියක් යන හැඟීම ජනතාව තුළ අවශ්‍ය පමණින් තිබුණේ නැත.

එසේම ජනතාව වෙනස්වීමට ඇති අකමැත්තද 'නිදහස'ට බලපානු ලැබේ. පැරණි නොගැලපෙන ජීවන විලාසිතාවලින්, අදහස්වලින්, සම්ප්‍රදායන්ගෙන් මිදීමට අසමත් නම් ජාතියක් චින්තනමය වශයෙන් 'නිදහස්' වන්නේ නැත.

ඒ අනුව ජනතාවගේ සමාජ විඥානය, ප්‍රගතියේ දෙසට වෙනස් කිරීමේ අභියෝගයද වත්මන් පාලනය ඉදිරියේ තිබේ. "ක්ලීන් ශ්‍රී ලංකා" වැඩසටහන තුළ මෙම අරමුණද පවතින බව අපි දනිමු.

මේ සියල්ලෙන් කියැවෙන්නේ අප ලෝකය සමග බැඳීම ප්‍රතික්ෂේප කරන, අපේ රට කොටු විය යුතුය යන්න නොවේ. දියුණු ලෝකය සමග අත්වැල් බැඳගෙන ලෝකයෙන් ලබාගත යුතුදේ උකහා ගෙන අප ජාතියක් ලෙස පෙරට යා යුතු වන අතර, එය හොඳින්ම කළ හැකි වන්නේ පරාධීන දුර්වල ජාතියක් ලෙස නොව ශක්තිමත් 'ස්වාධීන' ජාතියක් ලෙසය.

දැන් අපේ අරමුණ විය යුත්තේ ඒ මඟේ ගමන් කිරීමය. ජාතික පුනරුදයක් ඇති කරමින් සැබෑ ජාතික නිදහස අත්පත් කර ගැනීම සඳහා මෙතැන් සිට අප කටයුතු කළ යුතුය.

# ජනවරමේ වැදගත්ම සාධකය නව දේශපාලන සංස්කෘතියයි



**ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය, පාර්ලිමේන්තු සභානායක**

**බිමල් රත්නායක සහෝදරයා**

***ජනාධිපති අනුර කුමාර දිසානායක සහෝදරයාගේ චීන නිල සංචාරයට ඔබත් එක්වී සිටියා. චීන රජය සමග ගිවිසුම් ගණනාවක් අත්සන් කළ බව ප්‍රකාශයට පත් වුණා. මුළු ලෝකයේම අවධානය යොමු වුණු මේ සංචාරය සහ අත්සන් කළ ගිවිසුම්වලින් රටට හා පක්ෂයට ඇති වැදගත්කම පැහැදිලි කරන්නේ කොහොමද?***

අනුර සහෝදරයාගේ චීන නිල රාජ්‍ය සංචාරය පැති ගණනාවකින් සුවිශේෂී වෙනවා. අනුර සහෝදරයාගේ දෙවැනි නිල රාජ්‍ය සංචාරය සහ මේ අවුරුද්දේ පළමුවැනි සංචාරය වීම අපේ පැත්තෙන් විශේෂයක්. චීනය පැත්තෙන් ගත්තොත් වසරකට සාමාන්‍යයෙන් රාජ්‍ය නායකයන් 100ක් 110ක් අතර එන ලෝකයේ ප්‍රධානම රාජ්‍යතාන්ත්‍රික අගනුවරක්. 2025 අවුරුද්දේ චීනයේ යෙදුණු පළමු නිල රාජ්‍යතාන්ත්‍රික සංචාරයේ අවස්ථාව ශ්‍රී ලංකාවට කරන විශේෂ සැලකීමක් හැටියට ශ්‍රී ලංකාවට ලබාදුන්නා. ෂීජිංපින් ජනාධිපතිවරයාගේ සිට අනෙකුත් නායකත්වයන් දක්වා කාලසටහන් සකස් කරමින් ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා වෙනුවෙන් ඔවුන් ඉහළම බරක් තැබුවා.

චීන ජනාධිපතිතුමා සහ එරටට පැමිණෙන රාජ්‍ය නායකයන් අතර අනෙකුත් නිලධාරීන් නොමැතිව ජනාධිපතිවරු දෙදෙනා අතර කෙරෙන විශේෂ සාකච්ඡා සඳහා අවස්ථාව මෑත කාලයේ ලබාදී තිබුණේ නැහැ. නිල සාකච්ඡාවලට අමතරව ජනාධිපති අනුර සහෝදරයාත් විදේශ ඇමති විජිත හේරත් සහෝදරයා සහ මමත්, චීනයෙන් ඒ ජනාධිපතිතුමා සහ චීන තානාපතිතුමාත් ඇතුළත් සීමිත කවයක අවස්ථාවක්ද ලබාදුන්නා. චීන ජනාධිපතිතුමා ඔහු විසින් ලබාදුන් රාත්‍රී භෝජන සංග්‍රහයේදී පැයකට අධික කාලයක් සැහැල්ලුවෙන් සාකච්ඡා කරමින් ගත කළා. චීනයේ සමාජ මාධ්‍ය වගේම අනෙක් ධාරාවේ මාධ්‍යවලත් විශේෂ අවධානය මේ හමුවීම්වල දී තිබූ බව පසුව මට දැනගන්න ලැබුණා. රාජ්‍ය ගිවිසුම් 15ක් සහ විශේෂ එකඟතා ගිවිසුමකට අත්සන් කළා.

ජනතා විමුක්ති පෙරමුණ සහ චීන කොමියුනිස්ට් පක්ෂය අතර අත්සන් කළ ගිවිසුම විශේෂ එකක්. චීන ජනාධිපති ෂීජිංපින් සහෝදරයා සහ අපේ ජනාධිපති අනුර දිසානායක සහෝදරයා ඉදිරිපිට අත්සන් කළ මේ ගිවිසුම මගින් ජ.වි.පෙ. සහ චීන කොමියුනිස්ට් පක්ෂය අතර පැවති සම්බන්ධතාවය නිල වශයෙන් වෙනත් තලයකට ගෙනයාම සිදුවුණා. චීන රජයේ විවිධ ආයතන සහ ශ්‍රී ලංකාවේ විවිධ ආයතන අතර ඉදිරි ගිවිසුම් අත්සන් කළා. 'සයිනොපෙක්' කියන ලෝකයේ විශාලතම ඛනිජ තෙල් සමාගම සෘජු අයෝජනයක් ලෙස ඩොලර් බිලියන 3.7ක් ලංකාවට ගෙන ඒම විශේෂම ආයෝජන එකඟතාවක්. 'චයිනා මර්චන්ට්' ඇතුළු සමාගම් රැසක් එක්ක සෘජුව සාකච්ඡා කරන්න අවස්ථාව ලැබුණා. මෙරට නායකයන්ගේ දූෂිත ක්‍රියා නිසා අතරමඟ නැවැත්වීමට සිදුවූ ව්‍යාපෘති නැවත ආරම්භ කිරීමට තීරණය කිරීමත් අපේ ජයග්‍රහණයක්.

***දැන් ඔබ ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා ඇමති ධුරයේ වගකීම් දරනවාට අමතරව පාර්ලිමේන්තුවේ සභානායකවරයායි. මැතිවරණයේදී ජනතාවට දුන් පොරොන්දු අනුව නව දේශපාලන සංස්කෘතියක් බිහි කරන්න පාර්ලිමේන්තුව තුළ තිබෙන අභියෝගය මොන වගේද?***

ලැබී තිබෙන ජනවරමේ වැදගත් සහ ප්‍රබලම සාධකය නව දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමයි. ජනතාව ලබාදුන් හයිය මේ සඳහා ඉතාම වැදගත්. ජාතික ජන බලවේගයේ මන්ත්‍රීවරුන් සියලු දෙනා තමන්ගේ කාර්යභාරය මැනවින් තේරුම්ගෙන වගකීමෙන් ක්‍රියාකරනවා. පසුගිය කාලයේ හිස්ව තිබූ පාර්ලිමේන්තුව දැන් වගකීමකින් නියෝජනය කර ජනතාව වෙනුවෙන් කටයුතු කරනවා. අපේ ආණ්ඩුව පත්වීම දක්වා හිටපු ඇමතිවරුන් මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්නවලට උත්තර නොදී සිටියා. නමුත් අපේ ඇමතිවරු ඉතා සීමිත ප්‍රශ්න කිහිපයකට හැර අනෙකුත් සියලුම ප්‍රශ්නවලට උත්තර ලබාදුන්නා. උත්තර දෙන්න බැරිවූ ප්‍රශ්න ප්‍රමාණය සම්බන්ධයෙන් කල් ගත්තා. ඒ වගේම අයාලේ යමින් තිබූ විනය, හැසිරීම සහ න්‍යාය පත්‍රයට වැඩ කිරීම දැනටමත් සිදුකර තිබෙනවා. පාර්ලිමේන්තු කාරක සභා සියල්ල පත්කර අවසන් වුණාම තවත් වඩාත් කාර්යක්ෂමව ජනවරමේ හරය ක්‍රියාකාරිත්වයකට ගන්න පුළුවන්. පාර්ලිමේන්තුවට අනුබද්ධව නුවරඑළියේ තිබෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු නිකේතනය වගේම කොළඹ ශ්‍රාවස්තිය ප්‍රතිසංස්කරණයට වෙන්කර තිබූ අධික මුදල් වෙනස්කර ගනිමින් ගුණාත්මක වෙනසකට මුලපුරා තිබෙනවා.

එහෙත් විපක්ෂයේ සිටින පැරණි සංස්කෘතිය නියෝජනය කරන විපක්ෂයේ සීමිත මන්ත්‍රීවරු පිරිසක් පාර්ලිමේන්තුව කෝලම් මඩුවක් කර ගෙන ක්‍රියාකිරීම අපට තිබෙන අභියෝගයක්. දැන් එය සම්පූර්ණයෙන්ම පාලනය කර තිබෙනවා. මන්ත්‍රීවරු පත්වීමේ ප්‍රතිශතය 71%ක් තිබෙන්නේ අපේ ආණ්ඩුවට වුණත් කාරක සභා නියෝජනයේදී කුඩා පක්ෂවලට උපරිම අවස්ථාව ලබාදී කාල කළමනාකරණයේදී වැඩි ඉඩකඩක් ලබාදෙන්න අප ක්‍රියාකර තිබෙනවා. නමුත් විපක්ෂයේ වැඩිපුර මන්ත්‍රීවරු ඉන්න පක්ෂය අනෙකුත් කුඩා කණ්ඩායම්වල ඉන්න මන්ත්‍රීවරුන්ට ඉඩනොදී කටයුතු කරනවා. නව පාර්ලිමේන්තු සංස්කෘතියක් ගොඩනඟන්න ඒකත් බාධාවක්.

පාර්ලිමේන්තුවේ වියදම් අඩුකර ගනිමින් මන්ත්‍රීවරුන්ගේ ආහාර පාන වියදම ආවරණය කර ගැනීමේ මිලක් නියම කළා. ඒකට විරුද්ධව සමගි ජන බලවේගයේ සමහර මන්ත්‍රීවරු ගෝරනාඩු කරන්න පටන්ගෙන තිබෙනවා. ඒ හැමදේකටම වඩා අපේ පාර්ලිමේන්තු ඉතිහාසයේ කාන්තා නියෝජනය මෙවර 10%කට වඩා ලැබී තිබීම වටිනාම දෙයක්. මොන අභියෝග තිබුණත් පාර්ලිමේන්තුව ශක්තිමත් කරගෙන මන්ත්‍රීවරුන්ගේ භූමිකාව ශක්තිමත් කරගෙන ඉදිරියට යන්න අපට පුළුවන්.

***ජාතික ජන බලවේග ආණ්ඩුවේ මුල් මාස කිහිපය පිළිබඳව පවා විරුද්ධවාදී කණ්ඩායම් විශාල කලබලයක හා වියරුවක සිටින බව පේනවා?***

ඡන්දයකදී යම් කණ්ඩායමක් පැරදුණාම ඡන්ද ප්‍රචාරක රැලිවලදී හැසුරුණු මානසිකත්වයෙන්ම මාස හතර පහක් යනතුරු ක්‍රියාකරන්න උත්සාහ කරනවා. ඊට පස්සේ ඔවුන් සහමුලින්ම බිඳ වැටීම සාමාන්‍යයෙන් සිදුවෙනවා. ඡන්දයෙන් කුජීත වූ කණ්ඩායම ධනවත්ම සහ බලවත්වම හිටපු කණ්ඩායමක්. දූෂිත මුදල් බලයෙන් ඔවුන්ට ජනමාධ්‍යයේ විශාල ඉඩකඩක් ලබාදී තිබෙනවා. මාධ්‍ය බලය පාවිච්චි කරලා ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට විරුද්ධව විශාල ප්‍රචාර ගෙනයන්නේ මේ නිසයි. ජාතික ජන බලවේගය ජනාධිපතිවරණය ජයග්‍රහණයෙන් පසු විරුද්ධවාදීන් මර්දනය කිරීමේ කිසිම දෙයක් සිදු කළේ නැහැ. අනුර දිසානායක සහෝදරයාගේ ජනාධිපති ධුරය යටතේ පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වූයේ පැනක් හෝ කඩදාසියක්වත් රජයෙන් පාවිච්චි නොකරයි. ඒත් මේ ඡන්ද දෙකේදීම පැරදුණු දූෂිත කණ්ඩායම් රටේ

> **ඡන්ද දෙකේදීම පැරදුණු දූෂිත කණ්ඩායම් රටේ නව දේශපාලන සංස්කෘතියක් ගොඩනඟන්න දරන ප්‍රයත්නයට විරුද්ධ වෙමින් තාවකාලික දේශපාලන වාසියක් ලබා තිබෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට එරෙහිව කිසිම බයකින් තොරව ක්‍රියාකිරීමේ වාසියක් ලබාගෙන තිබෙනවා. ඒක ඉතාමත්ම තාවකාලිකයි. ධන බලය තිබුණත් ඉදිරියේදී ඔවුන් බිංදුවට වැටෙනවා.**

11 වැනි පිටුවට




# වැලන්ටයින් දිනයත් ළං වෙලා

# ආණ්ඩුව හොඳටම කළාද?

"අනුර හොඳටම කළා නේද ? කොයි කියපුවා කළාද? දීපු ඡන්දය ගැන සතුටුද? කකැ්බ`රසක්බන් පොඩි මිනිහගෙ බඩට ගැහුවා නේද?" වැනි පරාජිත, ඊනියා සටන්පාඨවලින් ගෙවුණු මාසයේ තම පැවැත්ම තහවුරු කරගැනීමට පරාජිත පැරණි පාලකයෝ උත්සාහ දැරූහ. නමුත් එම කිසිදු උත්සාහයක් ඵල දැරුවේ නැත. එය ඵල නොදැරීමට හේතු වූයේ ආණ්ඩුව සතු ජනවරම ඉතා අධිෂ්ඨානශීලී, සුබ බලාපොරොත්තු සහිත ජනවරමක් වූ නිසාය.

යථාර්ථය නම්, පවතින තත්වය තුළ ආණ්ඩුව හොඳටම කර තිබීමය; හොඳටම කරමින් සිටීමය; මෙයට වඩා හොඳට කිරීමටද බලාපොරොත්තු වෙමින් සිටීමය. ආණ්ඩුව අඩපණ වී තිබූ ආර්ථිකයට නව බලාපොරොත්තුවක් එකතුකරමින්, රුපියල ශක්තිමත් කළේය. ඒ අතර කොටස් වෙළෙඳපොල සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගත්තේ ලංකා ඉතිහාසයේ ඉහළම මිල වාර්තා කරමිනි. ජාත්‍යන්තර සබඳතා ඔස්සේ ව්‍යාපෘති හා ආයෝජන කැඳවමින්, ලෝකයට ලාංකේය ආර්ථිකය පිළිබඳ විශ්වාසය ගොඩනැගුවේය. ආර්ථිකයේ අවිනිශ්චිතතාව ඉවත්කරමින්, ආර්ථිකය වර්ධනීය හා බලාපොරොත්තු සහගත ආර්ථිකයක් බවට පත්කළේය. කඩාවැටී තිබූ නිෂ්පාදන ආර්ථිකයකට පණදියහැකි කර්මාන්ත නැවත පනගන්වමින් " ආර්ථිකයට හොඳටම කෙරුවේය".

"පොඩි මිනිහාගේ බඩට ගහනවා" වෙනුවට පොඩි මිනිහා වෙත කෙටිකාලීන ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ගෙනගියේය. නවතා දමා තිබූ වැඩිහිටි දීමනාව ලබාදුන්නේය. මාස් කන්නය වෙනුවෙන්, පැවති රු.15,000ක පොහොර සහනාධාරය රු.25,000 දක්වා වැඩි කළේය. අස්වැසුම ප්‍රතිලාභ ලබාදීමේ කාල සීමාව දිගුකොට වැඩිම අවදානමකට ලක්ව ඇති කණ්ඩායම් දෙකේ දීමනාව 2500කින් වැඩි කර ලබාදුන්නේය. පාසල් උපකරණ ලබාගැනීම වෙනුවෙන් රු.6000 බැගින් අඩු ආදායම්ලාභී දරුවන් වෙනුවෙන් ලබාදුන්නේය. අසාධාරණයකට ලක්වූ හා අස්වැසුම නොලැබුණු අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් නැවත සමීක්ෂණයක් සිදුකරමින්ද ඇත. අයහපත් කාලගුණය නිසා හානියට පත්වූ කුඹුරු වෙනුවෙන් මිලියන 166ක් ලබාදුන්නේය. මේ කෙටි කාලසීමාව තුළ"පොඩි මිනිහා වෙනුවෙන් ආණ්ඩුව හොඳට කර ඇත".

"කියපුවා කළාද? ඔව්..කියපුවා කරමින් සිටියි. නව දේශපාලන සංස්කෘතියකට අඩිතාලම දැමුවේ ජනාධිපතිවරයාගේ දිවුරුම් දීමේ උත්සවයේදී සිටය. ජනාධිපතිවරයා වෙනුවෙන් රට දරන වියදම අඩකින් අඩුකළේය. ජනාධිපති අරමුදල රටේ ග්‍රාමීය ජනතාව වෙනුවෙන් හා හදිසි සැත්කම් කටයුතු කඩිනම් කරගැනීම වෙනුවෙන් යෙදවීමට කටයුතු කළේය. මැති ඇමතිවරුන් වෙනුවෙන් දරන වියදම් අඩු කළේය. මංත්‍රී විශ්‍රාම වැටුප් අහෝසි කිරීම වෙනුවෙන් නීති සම්පාදය කරමින් පාලකයින් වෙනුවෙන් ජනතාව දරන බර අඩුකරමින් "කියුවාටත් වඩා හොඳටම කෙරුවේය".

"හොරු අල්ලන්නැද්ද?" හොරු අල්ලන්නට පටන්ගත්තේ පොලීසිය, අධිකරණය දේශපාලන බලපෑම්වලින් පළමුකොටම නිදහස්කරමිනි, නීතියේ ආධිපත්‍යය රැකදෙමිනි.. මේ වනවිට සියලුම හොරකම්, වංචා, දූෂණ නැවැත්වීමට ආරම්භයක් ගනිමින් හා ආදර්ශයක් දෙමින් සිටියි. හොරු ඇල්ලීමට පටන්ගත් නිසා හොරුත්, හොරුන් මත යැපුණු හොර කණ්ඩායම්ද කලබල වී, සියලු ප්‍රතිවිරෝධතා පසෙක දමමින් එකට එකතු වෙමින් සිටිති. මෙයින් පෙන්නුම් කරන්නේ ආණ්ඩුව, හොරු ඇල්ලීමත් හොඳටම කරමින් සිටින බවයි. වත්මන් ජනවරම වෙනුවෙන් බලාපොරොත්තු සහගතව එකතු වූ ජනයා, ලබාදුන් ඡන්දය ගැන පසුතැවීමකින් තොරව, ශක්මත්ව, නොසෙල්වී සිටින බවයි.

## ආදරණීය වැලන්ටයින්......

දුකින් පෙළෙන හැම
දුකින් මුදවන
සොවින් තැවෙන හැම
සොව නිවාලන
මුසපත් වූවෝ
කඩතුරා බිඳහෙළන
ප්‍රේමය පිරුණු කල
ලොවකි මේ හැඩවෙන...

මනුදම් පුරා හදවත්
හැම හිත් ගුණෙන් මෙත්
පරපුරක හීන කුළු
අහස් කුස වෙර දරන
සැබෑ කොට පුබුදන
පුනරුදයේ...
එනු මැනව මේ
මහා ආඛ්‍යානයට
හදපුරා සතුට හා
ආදරය රැගෙන...





පෙබරවාරි 14ත් ළං වෙලා. ඔන්න ආදරය කරන කොල්ලන්ට කෙල්ලන්ට අමතක නොවන දවස. වැලන්ටයින් එකට ලව් කරන කොල්ලන්ට කෙල්ලන්ට අමතරව කඩිමුඩියේ ලෑස්තිවෙන පිරිසකුත් ඉන්නවා. ඔයාලා දන්නවද ලංකාවේ විතරක් නෙවෙයි, ලෝකය පුරාත් වැඩියෙන්ම චොකලට් විකිණෙන, වැඩියෙන්ම මල් විකිණෙන, වැඩියෙන්ම ගිෆ්ට් විකිණෙන දවස වැලන්ටයින් දිනය කියලා. එතකොට තේරෙනවනේ වැලන්ටයින් එකට වැඩිපුරම ආදරය කරන්නේ කවුද කියලා. දැන් මේ දවස බිස්නස්කාරයින්ගේ දවසක් වෙලා. ඇත්තටම දැන් ඒක වැලන්ටයින් දිනය නෙවෙයි මුදලාලිලාගේ දවස කිවුවත් වරදක් නැහැ. ලෝකයේ හැම දෙයක්ම ලාභ උපයන දේවල් කරගන්න තමයි ගොඩක් අය ට්‍රයි කරන්නේ. ඇඳුම්පැළඳුම්, යානවාහන, ගෙවල්දොරවල්, මානව බැඳීම්, සංස්කෘතීන්, බෙහෙත්හේත් විතරක් නෙවෙයි ආහාර පවා මිනිසාගේ යහපත වෙනුවෙන් නිෂ්පාදන කරනවා වෙනුවට ලාභය උදෙසා පමණක් කරන නිෂ්පාදන බවට අද පත්කරගෙන තිබෙනවා. එසේ තිබියදී ආදරය පමණක් මිල නොවී තියේවිද?

අද ආදරයට මිලක් නියම වෙලා. ඒ විතරක් නෙවෙයි ඒකට කුලමල, ජාතිභේද, උඩරට පහතරටද විදිහට වෛරස්වලින් ලෙඩ කරලා තියෙන්නේ. පසුගිය කාලේ අපූරු නිව්ස් එකක් මාධ්‍යවල පළවුණා. ඒ, හලාවත ප්‍රදේශයේ වෙරළ තීරයේ හා ලැගුම්හල්වල සිටි පෙම්වතුන් 41ක් අත්අඩංගුවට ගත් බවයි. මෙවැනි කතා මීට කලිනුත් මාධ්‍යවල අහන්න ලැබිලා තියෙනවා. මේකෙන් මොකක්ද කියන්නේ. අපේ රටේ තරුණ තරුණියන්ට ආදරය කරන්න, කතා බහ කරන්න තැනක් නැහැ කියන එක නේද? ඒ නිසා නේද පෙම්වතුන්ට එවැනි තැන්වලට යන්න සිදුවෙන්නේ. මොකද මෙච්චර කාලයක් අපේ රට පාලනය කළ පාලකයෝ ඒවා ගැන හිතලවත් නැහැ. කොල්ලන්ට කෙල්ලන්ට ආදරය කරන්න තැනක් අවශ්‍යද නැද්ද කියලා අදාළ නැහැ. මොකද එයාලගේ දූ දරුවන්ට එහෙම ප්‍රශ්නයක් නැති නිසා. ඒ නිසා මේ විදියට ඔවුන් අත්අඩංගුවට ගන්න ක්‍රම හැදුවට ඒ ප්‍රශ්නය විසඳන්න ක්‍රම හදලා තිබුණෙ නැහැ. හැබැයි ඔන්න දැන් අලුත් ආණ්ඩුවක් පත්වෙලා. මේ ආණ්ඩුව ජනතාවාදී ආණ්ඩුවක් නේ. ඔවුන්ගේ ප්‍රතිපත්තිවලත් තිබුණා තරුණ තරුණියන්ට ආදරය කරන්න, සතුටුවෙන්න ඕන පරිසරයක් මේ රටේ නිර්මාණය කරන්න ඕනෑ කියලා. ඔවුන් ටිකෙන් ටික මේක අඩිතාලම හදමිනුයි ඉන්නේ. ඒ නිසා ආදරවන්තයින්ට සැබෑවටම ආදරය කරන වැලන්ටයින් දිනයක් බවට මෙවර පත්කරගන්න පුළුවන් වේවි.

පෙබරවාරි 14 වැලන්ටයින් දිනය කිවුවට බොහෝ දෙනෙක් එහි ඉතිහාසය දන්නේ නැහැ. වැලන්ටයින් දිනය බිස්නස් කරන මුදලාලිලා විතරක් නෙවෙයි එදාට මේ දිනය සමරන බොහෝ තරුණ තරුණියනුත් ඔය දිනය මොකක්ද දන්නේ නැති අය බොහෝයි. සමහර අයට හිතෙන්න පුළුවන් වැලන්ටයින් කියන්නෙ රෝසමල් විකුණන, චොකලට් විකුණන වෙළෙන්දෙක් කියලා. මොකද ඒ තරමටම බිස්නස් කරන මුදලාලිලා ඔහුව ඒ තැනට පත් කරලා තියෙන්නේ. නමුත් ඔහු ගැන විශාල කතාවක් තියනවා.

වැලන්ටයින් පූජකතුමා කියන්නේ තරුණ තරුණයින්ගේ සැබෑ ආදරය වෙනුවෙන් ජීවිතය පූජා කළ කෙනෙක්. ඒ, මීට වසර 200කට පමණ ඉහතදී වූ සිදුවීමක්. ඒ කාලයේ රෝමයේ ජුලියස් සීසර් කියලා පාලකයෙක් හිටියා කියලා ඔයාලා අහලා ඇතිනේ. ඔහුට තිබුණා ලෝකයේ රටවල් යටත් කරගැනීමේ උන්මාදයක්. ඒ සඳහා යුද්ධ කරන්න ඕනෑ වුණා. ඒ නිසා තමන්ගේ හමුදාවන්ට වැඩි වැඩියෙන් අවිවාහක සොල්දාදුවන් බඳවා ගැනීමට ඔහුට අවශ්‍ය වුණා. ඒ නිසා තම රටේ තරුණ තරුණියන්ට විවාහවීම නීතියෙන් තහනම් කළා. නමුත් ඒ අසාධාරණයට එරෙහිව වැලන්ටයින් පූජකවරයා විසින් ආදරවන්තයින්ව තමන්ගේ පල්ලිය තුළ හොර රහසේම විවාහ කළා. ඒ නිසා ජුලියස් සීසර් විසින් මෙම වැලන්ටයින් පූජකවරයා මරාදාන්න තීරණය කරනවා. අවසානයේ තරුණ තරුණියන්ගේ සැබෑ ආදරය වෙනුවෙන් වැලන්ටයින් පූජකවරයාට තම ජීවිතය පරිත්‍යාගය කරන්න සිදුවෙනවා. ඒ දිනය තමයි පෙබරවාරි 14 කියන්නේ. වැලන්ටයින් පූජකවරයාගේ ඒ උත්තුංග පරිත්‍යාගය වෙනුවෙනුයි ඒ දිනය සමරන්නේ. ඒ තමයි වැලන්ටයින් දිනයේ ඇත්ත කතාව.

ඒ නිසා වැලන්ටයින් දිනය කියන්නේ පැවතුණු ක්‍රමයට, අසාධාරණයට, පීඩනයට විරුද්ධව සටන් කළ මිනිසෙකුගේ දිනයක්. ඒ ක්‍රෑර පාලකයන්ට එරෙහිව තරුණ තරුණියන්ගේ අයිතිවාසිකම් දිනා දීම වෙනුවෙන් සටන් කළ මිනිසෙකුගේ දිනයක්. ඒ නිසා එම දිනය බිස්නස්කාරයන්ගේ බඩු විකුණ ගන්නා දිනයක් වෙනුවට සැබෑ අදරවන්තයින්ගේ දිනයක් බවට පරිවර්තනය කරගන්න ඕනෑ. ඒ විතරක්ද? දේපළවලට, කුලයට, ජාතියට, ආගමට, දෑවැද්දට ආදරය තීරණය වන පසුගාමීත්වයට එරෙහිව සටන් කළ යුතු දිනයක් කර ගන්න ඕනෑ. උදුරාගෙන ඇති තරුණ තරුණියන්ගේ, පෙම්වතුන්ගේ අයිතිවාසිකම්, ආදරය කරන්න ඇති අයිතිය හා සැබෑ ලබාගත යුතු දිනයක් බවට පත් කරන්න ඕනෑ. ඒ නිසා අපි විසින් පත්කරගත් ජනතාවාදී ආණ්ඩුවට වගේම තරුණ අපේත් වගකීම ඒ සැබෑ නිදහස වෙනුවෙන් එක්ව වැඩ කළ යුතු කාලයක් බව පැහැදිලියි.




### ලොව විශාලතම ඩයිනොසෝර පා සටහන් බොලිවියාවෙන් හමුවේ...



1994 ඔක්තෝම්බර් මාසයේදී බොලිවියාවෙහි ගල් වළකින් Cal Orck'o බිත්තියේ ඇති ලොව විශාලතම ඩයිනෝසෝර පා සටහන් නිධිය සොයා ගනු ලැබිණි.

Cal Orck'o හි ඩයිනොසෝර පා සටහන් විශිෂ්ට ලෙස සංරක්ෂණය වී ඇත්තේ අඩි සලකුණු තැබීමෙන් පසු දේශගුණික වෙනස්වීම් හේතුවෙනි. ඔවුන් විසින් සාදන ලද පා සටහන් නියඟයෙන් ශක්තිමත් වී ඇත. පසුව, තෙත් කාලගුණය නැවත පැමිණි අතර, පා සටහන් මඩ සහ අවසාදිතයට යටින් ආරක්ෂා කොට තබන ලදී, නියඟය සහ තෙත් වීමේ මෙම රටාව ක්‍රිටේසියස් යුගයේ සිට අද දක්වා හත් වතාවක් පුනරාවර්තනය වී තිබේ.

කැල් ඕර්කෝ ප්‍රපාතය මානව වර්ගයාගේ ස්වභාවික උරුමයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට යුනෙස්කෝව කටයුතු යොදා ඇත.

### ස්වල්බාර්ඩ් ගෝලීය බීජ සුරක්ෂිතාගාරය



Svalbard Global Seed Vault යනු දුරස්ථ ආක්ටික් Svalbard දූපත් සමූහයේ Spitsbergen නොර්වීජියානු දූපතේ ඇති ලෝකයේ විවිධ බෝග සුරක්ෂිත කිරීම සඳහා ඇති ගබඩාවකි. බීජ සුරක්ෂිතාගාරය ජාන බැංකු තුළ සංරක්ෂණය කර ඇති, අතර ලොව පුරා ඇති බීජවල අනුපිටපත් සඳහා දිගුකාලීන ගබඩාවක් සපයයි. බීජ සුරක්ෂිතාගාරය කළමනාකරණය කරනු ලබන්නේ නෝර්වීජියානු රජය, බෝග භාරය සහ නෝර්ඩික් ජාන සම්පත් මධ්‍යස්ථානය (NordGen) අතර ත්‍රෛපාර්ශ්වික ගිවිසුමක දක්වා ඇති නියමයන් යටතේය.

### පැරණි ටයිල් කළ ගල්ලෙනක් සිංහරාජයෙන් හමුවේ



සිංහරාජ වනාන්තරයට අයත් පාලින්දනුවර, රූණකන්ද වනයේ, රුසිගල කඳු ප්‍රදේශයේ පිහිටි කැබැල්ල ලෙනෙන් සුමට බිම් ඇතුරුම් පාෂාණ ඵලක හමු වී ඇත. එය වසර 13,000ක් තරම් ඉපැරණි ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් බව හෙළි වේ.

මේ ඇතුරුම් පාෂාණ වර්තමාන 'ටයිල්' මෙන් ඔප්නංවා, ඉතා ක්‍රමවත්ව නිම කර තිබීම මෙහි ඇති විශේෂත්වයයි.

ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය සහ චීනයේ සිචුආන් විශ්වවිද්‍යාලය ඒකාබද්ධව මේ පර්යේෂණ කටයුතු සිදු කරනු ලැබූ අතර, එහිදී කැණීම් කළමනාකරු ලෙස කටයුතු කරනු ලබන්නේ ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පාහියංගල සුමංගල හිමියන් වේ.

ශ්‍රී ලංකාවේ පිහිටි එකම ප්‍රාථමික වැසි වනාන්තරය වන සිංහරාජය ආශ්‍රිතව වසර 13,000ක් තරම් ඉපැරණි ප්‍රාග් ඓතිහාසික මානව සාධක හමු වූ ප්‍රථම අවස්ථාව මෙය වේ.

# ආණ්ඩුව හා බංකොලොත් විවේචකයෝ

පාර්ලිමේන්තු මැතිවරණයෙන් පසු මාලිමාවේ අලුත් ආණ්ඩුව පිහිටුවා මාස 03ක් ගත වන්නේ මෙම පෙබරවාරි මස අගටය. එසේ වුවද පරාජිතයන් නව පාලනය ගැන විවේචන ගොඩනගන්නේ, දිවා රෑ නොබලා කෑගසන්නේ ආණ්ඩුවට අවුරුදු 3ක් ගියා සේය. කිසිදු තර්කනයක්, නිවැරදි පදනමක් නැති බොරු, අර්ධ සත්‍යය හා විකෘති කිරීම්වලින් පිරුණු අවලාද හා මඩ හැර සැබෑ සාධනීය විවේචනයක් එහි දැකිය නොහැක.

සැබැවින්ම වර්තමාන විපක්ෂයේ කණ්ඩායම් සියල්ල ඡන්දයෙන් පරාජය වූවාට අමතරව, දේශපාලන වශයෙන් ප්‍රතික්ෂේප වූවාට අමතරව, මතවාදී වශයෙන් බංකොලොත් වී තිබේ. සාධනීය විවේචන වෙනුවට අවලාදවල පිහිට පැතීමට ඔවුන්ට සිදුව තිබෙන්නේ ඒ නිසාය. විපක්ෂය විසින් හසුරුවන සමාජ මාධ්‍ය ජාලා හා සමහර ජනමාධ්‍යද මෙම අවාසනාවන්ත තත්වයට ගොදුරු වී සිටියි. තමන් පතුරුවන අසත්‍ය ප්‍රකාශ පසුවදාම බොරු වුවත් ඔවුනට ලැජ්ජාවක් නැත. එක බොරුවක් හෙළිවූ විට ඔවුහු තවත් බොරුවක් කියති.

ඒ අතර ආණ්ඩු විරෝධී කණ්ඩායම් පතුරුවන වැරදි මතවලින් තාවකාලිකව හෝ නොමඟ යන සාමාන්‍ය පිරිසක්ද සිටිති. එබැවින් රට බංකොලොත් කළ, රට විනාශ කළ දැන් පරාජයේ වේදනාවෙන් වියරු වැටී සිටින මේ කණ්ඩායම් විසින් ගොඩනගන බොරු මතවල අරමුණ කුමක්දැයි අප වටහා ගත යුතුය.

'මාලිමාව ආණ්ඩුව' කරගෙන යාමට නොහැකි වනු ඇතැයිද එය ඉක්මනින් අර්බුදයට යනු ඇතැයිද මොවුන් සමහර විට ඇත්තටම හිතන්නට ඇත. මැතිවරණ සමයේ ඔවුන් විසින් රටට එසේ ප්‍රකාශ කරනු ලැබීය. එහෙත් දැන් ආණ්ඩුව ස්ථාවර වෙමින් දිගුකාලීන ඉලක්ක සහිතව පාලනයේත්, ආර්ථිකයේත් වෙනස්කම් සිදුකරගෙන ඉදිරියට යමින් සිටී.

ඒ අතර මහජන නියෝජිතයන් ලෙස මෙතෙක් ඔවුන් ලද වරප්‍රසාද එකින් එක අඩුවෙමින් යනු ඔවුහු දකිති. පැරණි වැරදිවලට නීතිය ක්‍රියාත්මක වීමද පටන් ගෙන ඇත. ඉදින් මේ සියල්ල විසින් ඔවුන්ව කෝපයටත්, වේදනාවටත්, පත්කරමින් තිබේ. විරුද්ධවාදීන්ගේ විවේචන මෙතරම් බාල හා දුෂ්ට මට්ටමට පත්වීමට එම තත්වයන් හේතු වී තිබේ.

ඔවුනට අවශ්‍යවී ඇත්තේ කුමක්ද? (I) ආණ්ඩුව ස්ථාවර නොවී අස්ථාවරව තැබීම (II) ආණ්ඩුව කෙරේ මහජනයාගේ විශ්වාසය බිඳීම (III) කැපකිරීමේ, පරිත්‍යාගයේ හා අදූෂිත බවේ යහගුණයන් විසින් මාලිමාවේ ආණ්ඩුවට හා එහි නායකයන්ට ජනතාව තුළ තිබෙන ගෞරවයට හානි කිරීම (IV) ආණ්ඩුවේ අවධානය වෙනතකට යොමුකර එයට තම කටයුතු නිරවුල් මනසකින් කරගෙන යාමට බාධා කිරීම (V) ආණ්ඩුවේ තනි තනි පුද්ගලයන් ඉලක්ක කර ඔවුනට එරෙහිව දිගටම බොරු අවලාද එල්ල කර, ඔවුන් මානසිකව පීඩාවට පක්කිරීම හා ජනතාව තුළ ඔවුනට ඇති විශ්වාසය පළුදු කිරීම වැනි දුෂ්ට අරමුණුය.

ආණ්ඩුව මාස දෙකක් තුනක් යන විටම ජනතාවගෙන් ප්‍රතික්ෂේප වන බව පෙන්වීමට මෙම ඊනියා විවේචකයෝ බොරු ගොතමින් සිටිති. මේ දිනවල පැවැත්වෙන සමුපකාර ඡන්ද පිළිබඳව ඔවුන් ගෙන යන ප්‍රචාරයත් ඊට නිදසුන්ය. මාලිමාවේ කණ්ඩායම් මෙතෙක් පැවැත්වූ සමුපකාර නිලවරණ වැනි සියයට අනූ නවයක්ම ජයගෙන තිබේ. එහෙත් කුමක් හෝ විශේෂ හේතුවක් මත එකක් දෙකක් ජයග්‍රහණය නොකළ විට එය මාලිමාවේ පරාජයක් ලෙස අතිශයෝක්තියට නගති. මෑතක හෝමාගම සමුපකාර නිලවරණයේ ප්‍රතිඵලය මීට උදාහරණයකි. එහෙත් කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම, මාලිමාවට ජයගත නොහැකි වුවද ඊට පෙරදින පැවති කැස්බෑව නිලවරණයෙන් සහ ඊට පෙර පැවැති කඩුවෙල ඇතුළු ඡන්ද කිහිපයක්ම ජය ගන්නේ මාලිමා කණ්ඩායමය. මෑතම අවිස්සාවේල්ල සමුපකාරයද මාලිමාව විසින් ජය ගන්නා ලදී.

එහෙත් මේ බොරු පළ කරන්නන් විවිධ නගරවල නම් කියමින් මාලිමාව පරදින බවට ව්‍යාජ මතයන් හදමින් සිටී. මීට හොඳම උදාහරණය හම්බන්තොට, හුංගම සමුපකාර ඡන්දය පිළිබඳ මාධ්‍ය වාර්තා කළ බොරුවය. ඔවුන් වාර්තා කළේ අඟුණකොලපැලැස්ස සමුපකාරය මාලිමාව පරාජය වූ බවය. එහෙත් සත්‍යය ලෙසම අඟුණකොලපැලැස්ස නමින් සමුපකාර සංගමයක් නැති අතර, සමුපකාර සංගමය හුංගම වේ. එය ජයගත්තේ මාලිමාවය.

සතුරන්ගේ බංකොලොත් බව තේරුම් ගැනීමට එම උදාහරණයම ප්‍රමාණවත්ය.

ආණ්ඩුවේ නායකයන් කරන ප්‍රකාශ හිතාමතාම විකෘති කිරීම්ද මෙම විවේචකයන්ගේ එක් කාර්යයක් වී තිබේ. එලෙස විකෘති කරන ලද ප්‍රවෘත්ති ව්‍යාජ ශීර්ෂයන් සහිතව සමාජ මාධ්‍යවල මුලින්ම පළ කරන අතර පසුව එම ව්‍යාජ ප්‍රවෘත්ති පදනම් කර ගනිමින් ප්‍රධාන ජන මාධ්‍ය විසින්ද එම වැරැදි අදහසම සමාජ ගත කිරීමට කටයුතු කරනු මෑත කාලයේ අපි දැක්කෙමු. සහල් පිළිබඳව 'රිලා උවදුර' පිළිබඳව, 'අලි - මිනිස්' ගැටුම පිළිබඳව 'පොල්' පිළිබඳව ඇමතිවරුන් කළ ප්‍රකාශ මුළුමනින්ම විකෘති කළ හැටි මීට උදාහරණයන්ය.

ආණ්ඩුවට විරුද්ධ කණ්ඩායම් ඉන් නතර වන්නේ නැත. ආණ්ඩුව කරන ඉතාමත් සාධනීය දේවල්ද හෑල්ලුවට ලක්කිරීමට සිතාමතා කටයුතු කරති.

පාසල් ළමුන් ලක්ෂ 13කට පමණ පොත් හා උපකරණ ගැනීමට රුපියල් 6000 බැගින් මුදලක් දුන් විට එම සහනය ගැන කතා නොකරන මෙම කුහක විවේචකයෝ සමහර පරිපාලනමය ගැටලු නිසා එම සහනය නොලැබුන අයෙක් දෙන්නෙක් සිටී නම් එය අතිශයෝක්තියට නඟා වැරදි මත වපුරති.

'ක්ලීන් ශ්‍රී ලංකා' ව්‍යාපෘතියද එවැනි උදාහරණයකි. එම ව්‍යාපෘතියෙන් රටට ලැබෙන විශාල වාසිය සඟවා එය ක්‍රියාත්මක කිරීමේදී පොලීසිය පැත්තෙන් සිදුවූ අඩුවක් උපයෝගී කරගෙන මුළු ව්‍යාපෘතියටම පහර දීමට කටයුතු කරති.

ඇමතිවරුන්ට මෙතෙක් හිමිව තිබූ වාහන 3ක් පාවිච්චි කිරීමේ වරප්‍රසාදය අහෝසි කර වාහන 2ට අඩුකර රජයෙන් ලබාගෙන ඉන්ධන ප්‍රමාණය මසකට ලීටර් 1800 සිට 900ට අඩු කළ විටත් විවේචකයන් පැවසුවේ ඇමතිවරුන්ට අලුතෙන් ඉන්ධන ලීටර් 900ක් ලබා දෙනවා යනුවෙනි.

මේ සියල්ලෙන් පෙනී යන්නේ විරුද්ධ පාර්ශ්ව සියල්ලම අපේක්ෂාභංගත්වයට පත්ව ඇති බවය; බියට කෝපයට පත්ව ඇති බවය; අනෙක් අතට ආණ්ඩුව ක්‍රමානුකූලව ස්ථාවර වෙමින් ඉදිරියට යන බවය; විපක්ෂයේ බලාපොරොත්තු කඩවී ඇති බවය. අපේ වගකීම වන්නේ සතුරු අවලාද අපහාසවලින් සැලීම හෝ ඒ වෙනුවෙන් කාලය නාස්ති කිරීම නොව, ජයග්‍රහණය කරා ඉදිරියට යාමය; අඩුපාඩු සකස් කර ගනිමින් ඉදිරියට යාමය.

වරක් මාවෝ සේතුං මෙසේ පවසා තිබිණ. "අපි, අපේ සාර්ථකත්වය මැනිය යුත්තේ අපේ මිතුරන්ගේ ප්‍රශංසාවේ මිහිරි වදන්වලින් නොව අපේ සතුරන්ගේ කෝපාවිෂ්ට සර්ජනාවේ රළු හඬිනි." අප විශ්වාස කළ යුතු සත්‍යය එයයි.



'මාලිමාව ආණ්ඩුව' කරගෙන යාමට නොහැකි වනු ඇතැයිද එය ඉක්මනින් අර්බුදයට යනු ඇතැයිද මොවුන් සමහර විට ඇත්තටම හිතන්නට ඇත. මැතිවරණ සමයේ ඔවුන් විසින් රටට එසේ ප්‍රකාශ කරනු ලැබීය. එහෙත් දැන් ආණ්ඩුව ස්ථාවර වෙමින් දිගුකාලීන ඉලක්ක සහිතව පාලනයේත්, ආර්ථිකයේත් වෙනස්කම් සිදුකරගෙන ඉදිරියට යමින් සිටී.



"මාධ්‍ය මගින් කරන්නේ බොරු කියන එක පමණක් නොවේ. සාවද්‍ය පරාවර්තනයන් ඇති කිරීමයි. බොරුව හා සාවද්‍ය පරාවර්තනයන් යනු වර්ග දෙකක්. බොරුව දැනුම මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. සාවද්‍ය පරාවර්තනයන් චින්තනය මත සෘණාත්මක බලපෑමක් ඇති කරනවා. එය තොරතුරු වසන්කිරීමට හෝ විකෘති කිරීමට සමාන නැහැ. එමගින් සිදුවන්නේ සිතීමට ඇති හැකියාව මොට කිරීමයි.''

**ෆිදෙල් කස්ත්‍රෝ**

# ඩොනල්ඩ් ට්‍රම්ප් නව ජනපතිවරයාට

## එක්සත් ජනපදය නව මාවතකට ගත හැකිද?

පසුගිය වසර අවසානයේ පැවති එක්සත් ජනපද ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කරන ලද ඩොනල්ඩ් ට්‍රම්ප් මේ වන විට සිය දෙවන ධූර කාලය සඳහා වැඩභාරගෙන ඇත. ජනපතිවරයෙකු ලෙස පත්වීමෙන් පසුව මහජන ඡන්දයෙන් ප්‍රතික්ෂේප වී නැවත ජනාධිපතිවරණයක් ජයග්‍රහණය කිරීමට හැකිවූ දෙවන එක්සත් ජනපද ජනාධිපතිවරයා ලෙසටද ඩොනල්ඩ් ට්‍රම්ප් ඉතිහාසයට එක් විය. ඔහු පරාජයට පත් වූ 2020 ජනාධිපතිවරණයේ ප්‍රතිඵල ඔහු විසින් පිලිනොගැනීමත් සමග ඔහුගේ පාක්ෂිකයින් විසින් සිදු කරන ලද විරෝධතා ක්‍රියාමාර්ග, විශේෂයෙන් කැපිටල් ගොඩනැගිල්ල අත්පත්කරගැනීම ආදී සිදුවීම්වලට අදාළව චූදිතයකු ලෙස ඩොනල්ඩ් ට්‍රම්ප්වද නම් කර තිබිණි.



ජාත්‍යන්තර සංවිධාන ආදී විවිධ කටයුතු සඳහා එක්සත් ජනපදයෙන් පිටතට මුදල් ගලායෑම නවතාලන බවත්, අනවසර සංක්‍රමණිකයන්ට එරෙහිව පියවර ගන්නා බවත්, ලෝකයේ මේ වන විට පවතින ප්‍රධාන යුද්ධවලින් එක්සත් ජනපදය ඉවත් වන බවත් ට්‍රම්ප්ගේ මැතිවරණ වේදිකාවේ ප්‍රධාන සටන්පාඨ විය. පසුගිය දශකයේ යුරෝපයේ දක්නට ලැබුනාක් මෙන්ම ජාතිකවාදී දේශපාලන නැඹුරුවක් ඒ තුළ දක්නට ලැබිණි. එක්සත් ජනපද ජාතිකවාදයට පක්ෂ වූ අන්ත දක්ෂිණාංශික දේශපාලන කණ්ඩායම්වල සහයද ට්‍රම්ප්ට ලැබිණි.

ඩොනල්ඩ් ට්‍රම්ප්ගේ ජයග්‍රහණයෙන් පසුව, සිය ධූර කාලයේ අවසන් සති කිහිපයේදී ට්‍රම්ප්ගේ මැතිවරණ සටන්පාඨවලට ප්‍රතිවිරුද්ධ ක්‍රියාමාර්ග ගණනාවක් හිටපු ජනාධිපති ජෝ බයිඩන් විසින් ගනු ලැබිණි. එතෙක් ත්‍රස්තවාදයට සහය ලබාදෙන රටක් ලෙස නම්කර තිබූ කියුබාව එම නාමාවලියෙන් ඉවත් කිරීම ඒ අතරින් ප්‍රධාන තීරණයක් විය. ඒ සම්බන්ධයෙන් ජෝ බයිඩන්ට ලොව සතරදෙසින් පැසසුම් ගලා ආව ද, සිය ධූර කාලයේ අවසන් සතිය තුළ මෙය සිදුකරන ලද්දේ සැබෑවටම කියුබාව සම්බන්ධ ප්‍රතිපත්ති වෙනස් වීම නිසා නොව සිය පුද්ගලික දේශපාලන වුවමනාව මත යන්නද සාකච්ඡාවට ලක්විය.

එක්සත් ජනපදයේ නව ජනාධිපතිවරයා දිවුරුම් දීම පසුගිය ජනවාරි 20 දිනට යෙදී තිබූ අතර එම දිවුරුම්දීමෙන් අනතුරුව තමන් සතු විධායක බලතල භාවිතා කරමින් විශේෂ තීන්දු සහ නියෝග ගණනාවක් ට්‍රම්ප් ජනාධිපතිවරයා විසින් අත්සන් කොට තිබිණි. එම තීන්දු බොහෝදුරට ඔහු විසින් සිය මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරය තුළ මතුකළ සටන්පාඨවලට සම්බන්ධ ඒවා වූ අතර ඒවා එක්සත් ජනපදයට මෙන්ම ලෝක දේශපාලනයටද බලපෑම් සහගත ඒවා විය.

ජාත්‍යන්තර සංවිධාන කිහිපයකින් ඉවත්වීම එම තීන්දු අතරින් ප්‍රධාන එකකි. ඒ අනුව ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් ඉවත්වන බවට එක්සත් ජනපදය නිවේදනය කළ අතර මීට පෙර ට්‍රම්ප් පාලන සමයේදීද මෙම තීන්දුව ගෙන තිබිණි. එක්සත් ජනපදය යනු ලෝක සෞඛ්‍ය සංවිධානයට වැඩිම ආධාර ලබාදෙන රටකි. කෙසේ නමුත් මෙම තීරණය ක්‍රියාත්මක වීමට තවත් වසරක් ගතවන අතර ඒ අතර කාලයේදී නව ජනාධිපතිවරයාගේ තීරණය ආපසු හැරවෙනු ඇතැයි බොහෝ දෙනෙක් මත පළ කර ඇත. මේ හා සමානම තවත් තීන්දුවක් ලෙස දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් සමුළුවෙන් ඉවත්වීමද සැලකිය හැක. එම සංවිධාන වෙත ලබාදෙන මුදල් රට තුළ රඳවා තබාගැනීම මෙම සංවිධානවලින් ඉවත්වීමේ ප්‍රධාන අරමුණ ලෙස පවතින බව දැකගත හැක. එනම්, එක්සත් ජනපද මුදල් ලෝකය වෙනුවෙන් නොව එක්සත් ජනපදය වෙනුවෙන් යොදාගත යුතුය යන අදහස මෙම ක්‍රියාමාර්ග තුළ ගැබ්ව ඇත.

එක්සත් ජනපදයට අනවසර සංක්‍රමණිකයන් පැමිණීම වැළැක්වීමටත්, දැනට සිටින අනවසර සංක්‍රමණිකයන්ට එරෙහිවත් තවත් තීරණ කිහිපයක්ම ගෙන ඇත. ඒ අනුව මෙක්සිකෝ දේශසීමාව වෙත අමතර භට කණ්ඩායම් යොමු කිරීමට ජනපතිවරයා පියවර ගෙන තිබේ. එසේම දැනට රට තුළ සිටින, අනවසරයෙන් සංක්‍රමණය වූවන් අත්අඩංගුවට ගෙන පිටුවහල් කිරීම මේ වනවිටත් ආරම්භ කර ඇත. එසේම යම් දරුවෙක් එක්සත් ජනපදය තුළ ඉපදීම එරට පුරවැසිභාවය ලැබීමට කරුණක් ලෙස මෙතෙක් සලකා බලනු ලැබුවද එය මින් ඉදිරියට නොසලකා හැරීමට තීරණය කර ඇත.

පසුගිය ඇෆ්ගනිස්ථාන යුද සමයේ එක්සත් ජනපදයට සහය ලබාදුන් ඇෆ්ගන් ජාතිකයින් දහස් ගණනකට එක්සත් ජනපදයේ පදිංචිවීමට අවසර ලබාදෙන බවට වූ පොරොන්දුව වැනි එකඟතාද මේ අනුව අවසන් කර ඇත. එලෙස එක්සත් ජනපදයට යාම සඳහා වීසා ලබා දී තිබූ ඇෆ්ගනිස්ථාන් ජාතිකයින්ටද තවදුරටත් එම වීසා වලංගු නොවන බව දන්වා ඇත.

මැතිවරණ වේදිකාවේදී ඩොනල්ඩ් ට්‍රම්ප් පැවසූ ආකාරයට තවදුරටත් ලෝකයේ තැන්තැන්වල සිදුකරන යුද්ධ වෙනුවෙන් එක්සත් ජනපදය සිදුකරන මුදල් වියදම් කිරීම් නතරකිරීමට යෝජනා කිරීමද ප්‍රධාන මාතෘකාවක් විය. ඒ අනුව රුසියා - යුක්රේන යුද්ධය සහ ඊශ්‍රායල් - පලස්තීන යුද්ධය නතර කිරීමට කටයුතු කරන බව නව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇත. යුක්‍රේන යුද්ධය අවසන් කිරීමේ වැඩි වගකීම ඇත්තේ රුසියාවට බව පැවසූ ට්‍රම්ප්, සාම සාකච්ඡා සඳහා රුසියාවට ආරාධනා කර ඇති අතර රුසියාව පාර්ශවයෙන්ද මේ වන විට එයට යහපත් ප්‍රතිචාර දක්වා ඇත. යුක්‍රේනයද ඒ සඳහා එකඟ බව ප්‍රකාශ කර ඇත.

එමෙන්ම, නව ජනාධිපතිවරයා දිවුරුම් දීමට පෙර සිය නියෝජිතයින් කටාර්හි දෝහා අගනුවරට යවා ගාසා තීරයේ පවතින ඊශ්‍රායල් පලස්තීන යුද්ධය නතර කිරීම සමබන්ධව සාකච්ඡා ආරම්භ කර තිබිණි. එයට ඊශ්‍රායලය පාර්ශවයෙන් යහපත් ප්‍රතිචාර ලැබී තිබිණි. කෙසේ නමුත් ගාසා තීරයේ පාලකයින් ලෙස හමාස් සංවිධානය පිළිනොගන්නා බවද එක්සත් ජනපදය ප්‍රකාශ කර තිබේ.

ඊශ්‍රායලය සහ තුර්කිය හැර ලොව අන් සෑම රටකටම එක්සත් ජනපදය විසින් ලබාදෙන ආධාර නතර කිරීමටද නව පාලනය විසින් තීරණය කර ඇත. ඒ අනුව වත්මන් යුද තත්වය පදනම් කරගනිමින් යුක්‍රේනයට ලබාදෙමින් තිබූ ආධාරද එක්සත් ජනපදය විසින් නවතා දමා ඇත. තුර්කිය සහ ඊශ්‍රායලය මෙතෙක් එයට ඇතුළත් නොවී ඇත්තේ සිරියාව ඇතුළු අදාළ කලාපයේ පවතින දේශපාලන තත්වය ගැන සැලකිලිමත් වීම නිසා විය හැක.

හිටපු ජනාධිපති ජෝ බයිඩන් විසින් සිය ධූර කාලයේ අවසන් සතියේදී ත්‍රස්තවාදයට උදව් ලබාදෙන රටවල් ලෙස එක්සත් ජනපදය විසින් නම් කර ඇති රටවල් ලැයිස්තුවෙන් කියුබාව ඉවත්කර ගැනුනද ට්‍රම්ප් නව ජනාධිපතිවරයා එය නැවත එක් කිරීමට තීරණය කර ඇත. ඒ අනුව සිරකරුවන් නිදහස් කිරීම ඇතුළු රටවල් දෙක අතර සිදුවෙමින් තිබූ ප්‍රගතිගාමී එකඟතා නැවතත් අඩපණ වී ඇත. නව ජනාධිපතිවරයාගේ දේශපාලන වැඩපිළිවෙල අනුව එක්සත් ජනපදය කියුබාව සම්බන්ධයෙන් තවදුරටත් දැඩි තීන්දු ගනු ඇත.

නව ජනාධිපතිවරයාගේ මුල්ම තීන්දු අතරින් තවත් මතභේදාත්මක තීන්දුවක් වූයේ සංක්‍රාන්ති ලිංගිකයින් සහ සුලු ජන කොටස්වල අයිතීන් කප්පාදු කිරීමට යෝජනා කිරීමයි. ඒ අනුව සංක්‍රාන්ති ලිංගිකයින් පිළිගැනීමට ලක්කල මූලික නීතිරීති අහෝසි වන අතර එක්සත් ජනපදය පිළිගනු ලබන්නේ ගැහැනු - පිරිමි කාණ්ඩ දෙක පමණක් බව ප්‍රකාශයට පත්කරන ලදී. එසේම ඔවුන් වෙනුවෙන් සහ සුළු ජාතිකයින් වෙනුවෙන් රජය විසින් දෙනු ලබන සහනාධාර සියල්ල නවතා දැමීමටත්, ඔවුන් වෙනුවෙන් පිහිටුවා ඇති සියලු රාජ්‍ය ආයතන අහෝසි කිරීමටත් තීරණය කර ඇත. ඒ අනුව සංක්‍රාන්ති ලිංගිකයින්, සුළු ජාතික ජන කොටස් වෙනුවෙන් සේවය කළ රාජ්‍ය සේවකයන් සියලු දෙනා මේ වන විටත් අනිවාර්ය නිවාඩු යැවීමට නව පාලනය කටයුතු කර ඇත.

චීනය විසින් ඔත්තු බැලීමට සහ පුද්ගල දත්ත සොරකම් කිරීමට ටික්ටොක් සමාජ මාධ්‍ය භාවිතා කරන බව පවසා එය තහනම් කිරීමට පැවති බයිඩන් පාලනය කටයුතු කර තිබිණි. ඒ අනුව ජනවාරි 19 දින එක්සත් ජනපදය පුරා ටික්ටොක් සමාජ මාධ්‍ය තහනම් වූව ද එය සීමා වූයේ පැය 24කට පමණි. ජනවාරි 20 වනදා දිවුරුම් දුන් නව ජනාධිපතිවරයා එක්සත් ජනපදය තුළ ටික්ටොක් ක්‍රියාකාරීත්වය එක්සත් ජනපද සමාගමකට ලබාදීම සඳහා මාස 3ක අමතර කාලයක් ලබාදෙන ලදී. එසේම කෘත්‍රිම බුද්ධිය සම්බන්ධ පර්යේෂණ සඳහා ආයෝජන වැඩි කළ යුතුව ඇතැයිද නව ජනාධිපතිවරයා ප්‍රකාශ කර ඇත.

ඉහත සඳහන් කරන ලද්දේ ඩොනල්ඩ් ට්‍රම්ප් නව ජනාධිපතිවරයා ලෙස දිවුරුම් දීමෙන් පසු ගන්නා මූලික තීන්දු අතරින් ප්‍රමුඛ වන කිහිපයක් පමණි. එම තීන්දු කිහිපය මගින් නව ජනාධිපතිවරයාගේ ජාතිකවාදී දේශපාලන ප්‍රවේශය ගැන මූලික අවබොධයක් ගත හැක. එවා තවදුරටත් එක්සත් ජනපදය සහ එරට ජනතාවගේ අනාගතය ගැන තීන්දු පමණක් නොවේ. ජාත්‍යන්තර දේශපාලනයත්, එය තුළ එක්සත් ජනපදයට හිමි ස්ථානයත් පිළිබඳවද එම තීන්දු සැලකිය යුතු බලපෑමක් එල්ල කරනු ඇත.

මන්ද යත් අද එක්සත් ජනපදය විසින් ලෝක දේශපාලනය මෙන්ම ආර්ථිකය තුළ තමන්ගේ ස්ථානය හිමිකරගෙන ඇත්තේ රට තුළ සිදුකරන ආර්ථික හෝ දේශපාලන මැදිහත්වීම් මත පමණක් නොවේ. වත්මන් ලොකයේ ලෝක බලවතුන් සිය බලපරාක්‍රමය ලොවට පෙන්වා සිටින්නේ ආර්ථික මට්ටමින් හෝ මිලිටරි හැකියාවන්ගෙන් පමණක් නොවේ. ජාත්‍යන්තර සංවිධාන තුළ ක්‍රියාකාරිත්වය පවා ලෝක දේශපාලන බලවතුන් අතර තරගයේදී එක්සත් ජනපදයේ බලවත්කම පෙන්වන සාධකයකි. එසේ නම් ලොව තුළ බල කේන්ද්‍ර කිහිපයක් නිර්මාණය වෙමින් පවතින අවධියක, ලෝක දේශපාලනයේ තමන්ට හිමි ස්ථානයත් ආරක්ෂා කරගනිමින් තමන් බලාපොරොත්තු වන ජාතිකවාදී මාවතක සැබවින්ම ගමන් කළ හැකිද යන ගැටලුව නව ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් පමණක් නොව සමස්ත එක්සත් ජනපදය හමුවේ පවතී.

## බෙලරුස් - ඇලෙක්සැන්ඩර් ලුකාෂෙන්කෝ නැවත ජයගෙන



සෝවියට් දේශයේ බිඳවැටීමෙන් පසු නව රාජ්‍යයක් ලෙස ස්ථාපනය වූ බෙලරුස්හි ප්‍රථම ජනාධිපතිවරයා ලෙස 1994දී තේරී පත්වූ ඇලෙක්සැන්ඩර් ලුකාෂෙන්කෝ මෙවර ජනාධිපතිවරණයෙන්ද නැවත ජයග්‍රහණය කර ඇත. 1994 සිට අද දක්වා සියලු ජනාධිපතිවරණ ජයග්‍රහණය කර ඇති ලුකාෂෙන්කෝ මේ ආරම්භ කිරීමට සූදානම් වෙන්නේ සිය 7වැනි ධූර කාලයයි. පසුගිය ජනවාරි මස 26වැනි දින පැවති ජනාධිපතිවරණයෙන් 86.8%ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගැනීමට ඔහු සමත්ව ඇත.

අඛණ්ඩව වැඩිම කාලයක් සිය තනතුරේ රැඳී සිටින යුරෝපානු රාජ්‍ය නායකයා වන්නේද ලුකාෂෙන්කෝය. මේ වන විට 70 වන වියේ පසුවන ඔහු සෝවියට් දේශය බිඳවැටීමට ප්‍රථම සෝවියට් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයෙක් ලෙස සිය දේශපාලන ගමන අරඹා තිබිණි. රුසියාවේ දේශසීමාවේ පවතින රාජ්‍ය අතුරින් රුසියාවට වඩාත් මිත්‍ර රටක් ලෙස බෙලරුස් පවත්වාගෙන යාමට ඔහු එදා සිට අද දක්වා කටයුතු කර ඇත.

## කොංගෝව සහ රුවන්ඩාව ජාත්‍යන්තර සබඳතා බිඳවට්ටාගෙන



කොංගෝව රුවන්ඩාවේ පවතින කොංගෝ තානාපති කාර්යාලයේ නිලධාරීන් ආපසු ගෙන්වාගැනීමට පසුගියදා කටයුතු කර තිබුණි. එසේම කොංගෝවේ තිබූ රුවන්ඩා තානාපති කාර්යාලය වසා දැමීමටද පියවර ගෙන ඇත.

2022 වසරේ පටන් මෙම රටවල් දෙක අතර විරසකයන් වර්ධනය වෙමින් පැවතුණි. කොංගෝව චෝදනා කරන්නේ රුවන්ඩා හමුදා කොංගෝ දේශසීමා නොසලකා හරිමින් කටයුතු කරන බවත්, උතුරු කිව් පලාතේ කැරලිකරුවන්ට සහය ලබාදන බවත්ය. මෙම ප්‍රදේශයේ 'මාර්තු 23 ව්‍යාපාරයේ' (කොංගෝලියානු විප්ලවීය හමුදාව) සන්නද්ධ ක්‍රියාකාරකම් පසුගිය වසර කිහිපය තුළ උත්සන්නව පවතින අතර එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාද පළාත තුළ ස්ථානගත කර ඇත. මෙම සංවිධානය 'ටුට්සි' ජාතිකත්වය පදනම් කරගනිමින් බිහිවූ සංවිධානයක් වන අතර රුවන්ඩාවේ පාලන බලය හොබවන්නේද 'ටුට්සි' ජාතිකත්වය විසිනි.

## ඊශ්‍රායලය සහ පලස්තීනය සිරකරුවන් හුවමාරු කරගනිමින්



පලස්තීනයේ ගාසා තීරයේ මාස 15ක් පමණ තිස්සේ අඛණ්ඩව පැවති යුද තත්වය තාවකාලිකව සමනය වී ඇත්තේ සටන් විරාමයක් සඳහා දෙපාර්ශවය එකඟතාවයට පැමිණීමත් සමගයි. ඒ එකඟතාවයන්ගේ කොන්දේසි අනුව දෙපාර්ශවය විසින් සිය ග්‍රහණයේ සිටින සිරකරුවන් හුවමාරු කරගැනීම් ආරම්භ කර ඇත.

ඒ අනුව 2023 ඔක්තෝබර් 07 දින හමාස් සංවිධානය විසින් ඊශ්‍රායල ජනපදවලට එල්ල කරන ලද ප්‍රහාරයේදී ප්‍රාණඇපයට ගත් ඊශ්‍රායල කාන්තාවන් සිව් දෙනෙකු පසුගිය ජනවාරි 25වැනි දින නිදහස් කරන ලද අතර ඊට ප්‍රතිචාර ලෙස ඊශ්‍රායලය විසින් පලස්තීන සිරකරුවන් 200 දෙනෙකු නිදහස් කරන ලදී.

# 2025 අයවැය අපේක්ෂාව හා යථාර්ථය!

නව රජයේ පළමු අයවැය 2025 පෙබරවාරි මුල් සතියේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරීමට සූදානම්ය. මෙම මංගල අයවැය ආණ්ඩුවේ ඉදිරි ගමන පිළිබඳව පැතිකඩක් වනු ඇත. මාස 3කදී ආණ්ඩුව තම ගමන තුළ ලද ජයග්‍රහණයක් මෙන්ම අත්දැකීම්ද කැටිකර ඉදිරි වසරට ප්‍රතිපාදන වෙන්කර ගැනීම වෙනුවෙන් පළමු අයවැය සකස් කරනු ඇත. ආණ්ඩුවට දැනට කටයුතු කිරීමට සිදුවී ඇත්තේ පසුගිය පැවැති දූෂිත ධනේශ්වර පාලනය විසින් ගෙන ආ ජනතා ද්‍රෝහී ප්‍රතිපත්ති වෙනස් කිරීමේ පරිවර්තනීය කාලයක බව අප කාටත් පැහැදිලිය. ඉතා ඉක්මනින් ආදායම ඉහළ නංවමින් හා වියදම් කළමනාකරණය කරමින් පැවැති බංකොලොත්භාවයෙන් නිල වශයෙන්ම නිදහස් වීමට ලැබීම ආණ්ඩුව අර්ථික වශයෙන් ලද පළමු හා සුවිශේෂීම ජයග්‍රහණයයි.

ආණ්ඩුවක් වෙනස් වී ආණ්ඩුවක් මාරු වීම දේශපාලනික පරිවර්තනයකි. එය සැබෑම ජනතා ජයග්‍රහණයක් වන්නේ ආර්ථික පරිවර්තනයක්ද සමගය. මේ දේශපාලන පරිවර්තනය ආර්ථික පරිවර්තනයක් කිරීම එකවර පැය කිහිපයකින් දින මාස ගණනින් ගණන් බලා සිදු කළ නොහැකිය. ඒ සඳහා ප්‍රතිපත්තිමය වෙනසක්ද, ක්‍රියාමාර්ගවල වෙනසක් ද අවශ්‍යය. ආණ්ඩුවට දෙකොණ පත්තු වූ විලක්කුවක් ලද බව පැහැදිලිය. එක පැත්තකින් කඩා වැටීම නිසා ජනතාවගේ පීඩනය තීව්‍ර වන ආර්ථිකයත් අනෙක් පසින් ඒ ආර්ථික අර්බුදය නිසාම විවිධ කොන්දේසි පැනවූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සීමාවනුත් ඇත. අනුර දිසානායක ප්‍රමුඛ ජන බලවේගය පාලනයට බාර ගැනීමට සිදුව තිබෙන්නේ, මේ අන්ත දෙකෙහිම කළමනාකරණයක් සහිතව ජනතා විශ්වාසයද රැක ගනිමින් පාලනය මෙහෙයවීමේ අසීරු අභියෝගයයි.

## අතුරු සම්මතයෙන් අයවැයට

අදූරදර්ශී ප්‍රතිපත්ති නිසාවෙන් බංකොලොත්භාවයට ඇද දැමූ ආර්ථිකයක් සහිත රටක් ජන බලවේගයෙන් අනුර දිසානායක ජනාධිපති සහෝදරයා ඇතුළු ආණ්ඩුවට ලැබුණා සේම 2024 අවසාන කාර්තුවේ 2025 වෙනුවෙන් අයවැයක් නිසි පරිදි සම්මත වී නැත. 2024 නොවැම්බර් 21 පළමු පාර්ලිමේන්තුව රැස්විය. දෙසැම්බර් 31ට පෙර අයවැයක් සකස් කර ඉදිරිපත් කිරීමට තරම් ප්‍රමාණවත් කාලයක් නව අමාත්‍ය මණ්ඩලයට නොවීය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සඳහා වන ඊළඟ සාකච්ඡාවද ආරම්භ කිරීමේ කාලයද පැමිණ තිබිණි.

එම ණය පහසුකම් අතහැර සාකච්ඡා, අවසන් කළහොත් රට අර්බුදයෙන් අර්බුදයටම පත්වීම ඒ මොහොතේ කටුක යථාර්ථය විය. ඒ නිසා ජනතා අභිලාෂයද ඉටු කරමින් එම සාකච්ඡාද සාර්ථක කර ගැනීම මගින් ආර්ථිකය ස්ථාවර කර ගැනීමේ භාරදූර අභියෝගය අනුර සහෝදරයා ප්‍රමුඛ නව නායකත්වය සහ අදාළ නිලධාරීන් හමුවේ විය. පසුගිය රාජපක්ෂ - වික්‍රමසිංහ පාලනය විසින් ජාත්‍යන්තර ප්‍රජාවට 'අනුර ආවොත් රට විනාසයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල රට හැර යනවා' ආදී වශයෙන් ජාත්‍යන්තර ප්‍රජාවට හා ආයෝජකයන්ට හදන ලද බොරු බියද තුරන් කරමින්, පළමු වටයේදීම ආණ්ඩුව තම සාර්ථකත්වය ඔප්පු කළේය. මාස ගණන් ඇදෙන සාකච්ඡා දින 10කින් අවසන් කරමින් මූල්‍ය අරමුදලේ ණය වාරිකය ලබා ගැනීමට ඔවුහු සමත් වූහ.



2025 මුල් මාස 4ට අතුරු සම්මත ගිණුමක් ඉදිරිපත් කරමින් ප්‍රාථමික වියදම්වලට රුපියල් බිලියන 1425ක්ද, සාමාන්‍ය ණය සේවාකරණය හා ණය ප්‍රතිව්‍යුහගතකරණයට අදාළ වියදමද ඇතුළුව තවත් බිලියන 4175ක්ද, වෙන් කර ගන්නා ලදී. ඒ අනුව සමස්ත ණය සේවාකරණයද සහිතව 2025 මුල් මාස 6ක මුළු වියදම බිලියන 5600ක් විය. එයින් බිලියන 3000ක්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ප්‍රතිව්‍යුහකරණ සාකච්ඡා දෙසැම්බර් 31ට පෙර අවසන් කිරීමට අසමත් වුවහොත් 2024ට අදාළව වෙන් කිරීම විය. නමුත්, 2024 වසර තුළදීම එම සාකච්ඡා සාර්ථක වීම විසින් රුපියල් බිලියන 3000ක වෙන් කළ මුදල 2025 වසරට වෙනත් වියදම පියවීම සඳහා ඉතිරියක් කර ගැනීමට ආණ්ඩුව සමත් විය.

## විසර්ජන පනත හා අයවැය අපේක්ෂාවන්

ජනවාරි 09 විසර්ජන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් විය. පෙබරවාරි දෙවන සතියේ අයවැය කථාවෙන් පසු පාර්ලිමේන්තුවේ අයවැය විවාදය ආරම්භ කෙරෙනු ඇත. රුපියල් බිලියන 6000ක් ඉක්මවූ පසුගිය වසරවල වියදම මෙවර විසර්ජන පනතින්ම රුපියල් බිලියන 4218කට අඩු කර ආණ්ඩුව වියදම් අඩු කිරීමේ ආදර්ශ දී ඇත. (පුනරාවර්ථන වියදම් බිලියන 2898, ප්‍රාග්ධන වියදම රුපියල් බිලියන 1320)

2024 වසරේදී මුදල් අමාත්‍යාංශයට පමණක් වෙන්කළ මුදල රුපියල් බිලියන 1077කි. එය 2025 වසරේදී රුපියල් බිලියන 714කට අඩු කර ඇත. වැඩිම දෙවැනියට වියදම වෙන්කර ඇත්තේ සෞඛ්‍ය හා ජන මාධ්‍ය අමාත්‍යාංශයටය. එය රුපියල් බිලියන 508කි. රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට බිලියන 497ක්ද, ප්‍රවාහන, මහාමාර්ග, වරාය හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයට රුපියල් බිලියන 473ක් ද වෙන්කර ඇත. ආරක්ෂක අමාත්‍යාංශයට රුපියල් බිලියන 442කි. අධ්‍යාපන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයට රුපියල් බිලියන 271ක් වෙන්කර ඇත. නව රජයේ ක්‍රියාකාරීම ප්‍රධාන අමාත්‍යාංශ 08ක් සඳහා මුළු වියදම්වලින් 90%ක් වෙන් කරනු ලැබ ඇත.

## අයවැය යෝජනා

අයවැය වියදම් ඇස්තමේන්තු විසර්ජන පනත මගින් දැනටමත් සමාජ ගත කර ඇතත්, අයවැය යෝජනා සමාජ ගත කර නැත. වියදම පියවා ගන්නා නව ආදායම් යෝජනා අයවැය යෝජනා ලෙස අයවැය කතාව මගින් ප්‍රකාශයට පත් කරනු ඇත. අයවැය කතාව මගින් ඉදිරිපත් කරන යෝජනාවන්හි දිශානතිය පිළිබඳව දැනටමත් සමාජගත වී ඇති බොහෝ කරුණු මගින් යම් අදහසක් අප කාටත් ලබා ගත හැකිය.

ජනතාවට සහන සලසන අතරම නිෂ්පාදන ආර්ථිකය පුළුල් ලෙස පණ ගන්වන අයවැයක් මෙවර ඉදිරිපත් කරන බව ජනාධිපති අනුර දිසානායක සහෝදරයා අවස්ථා කිහිපයකදීම ප්‍රසිද්ධියේම ප්‍රකාශ කර ඇත. ඒ අනුව රජයේ සේවකයන්ට ඉතිහාසයේ මින් පෙර නොවූ පරිදි විශේෂ වැටුප් වැඩිවීමක් දීමනා ලෙස නොව මූලික වැටුපටම වැඩි කිරීමක් ලබාදීමට නියමිතය. එය ජීවන බරින් පෙළෙන රාජ්‍ය සේවකයින්ට විශේෂ සහනයක් වනු ඇත. ඒ හා සමානවම විශ්‍රාමික ජනතාවටද විශ්‍රාම වැටුප් දීමනා වැඩිවීමක් ලබාදීමට අපේක්ෂිතය. රජයේ වියදම් කළමනාකරණයේ විශේෂ දක්ෂතාවය නිසා රාජ්‍ය වියදම අඩුවී ඇති අතරම, රජයේ කටයුතු කෙරෙහි ව්‍යාපාරික හා කර්මාන්තකරුවන්ගේ විශ්වාසය වැඩිවීමත් සමග බදු ආදායම් ඉපැයීමද ඉහළ ගොස් තිබේ.

සංචාරක කර්මාන්තයෙන් ලද ඉහළ ආදායමද අයවැයේදී ජනතාවට විශාල සහනයක් දීමට යොදා ගත හැකි වනු ඇත. දැනටමත් දැනුවත් කරුණු අනුව නිෂ්පාදන ක්ෂේත්‍රයේ හා අපනයන ආදායම ජනිත කරනු ලබන ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබ ඇත. පවතින සහල් පොල් ආදී අත්‍යවශ්‍ය ආහාර හිඟය වත්මන් ආණ්ඩුව නිර්මාණය කළ අර්බුදයක් නොවන බව අපි කවුරුත් දනිමු. නමුත්, මේ පැන නැගි අර්බුදය මගින්ම නව රජයට ලත් අත්දැකීම මත 2025 වසරේදී පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබා දෙනු ලැබ ඇත. එසේම පොල් හිඟයට පිළියම ලෙස පොල් නැවත වගාව ඇරඹීමටත්, පොල් සඳහා අවශ්‍ය පොහොර කඩිනමින් ලබාදීමටත් රජය දැනටමත් කටයුතු කර තිබේ.

වාහන ආනයනයට අවසර ලබාදීම අයවැයට පෙර මේ පෙබරවාරියේ ආරම්භ කරන ලදී. දැනටමත් කර්මාන්ත අරඹා ඇති දේශීය වාහන එකලස් කිරීමේ කර්මාන්තයද ආරක්ෂා කරමින් අපගේ දැනට ඇති විදේශ විනිමය සංචිත ප්‍රමාණයද කළමනාකරණය කරගනිමින් එම වාහන ගෙන්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත.

## අත්‍යවශ්‍ය ආහාර මිල

නව රජය ආරම්භයේම සිටියේ හිසරදයක් බවට පත්ව ඇති හාල්, පොල්, ලූණු වැනි ජනතාවගේ අත්‍යවශ්‍ය ආහාර මිල හා ප්‍රමාණවත් පරිදි සැපයුම් දාමය පවත්වාගෙන යාමයි. හාල්. හාල් ප්‍රශ්නයේදී ජනතාවට වඩා කලබල වූයේ විපක්ෂයයි. හාල් මාෆියාවද තමන්ට අත්වන ඉරණම කලින් දැන කලබල විය. නමුත් ජනාධිපතිවරයා කලින් හිටපු කෘෂිකර්ම අමාත්‍යවරයා නිසාම කල්යල් බලා නිවැරදිව අර්බුදයට සූදානම් විය. දැන් ඒ ප්‍රශ්නය අවසන්ය. පොල් ප්‍රශ්නය මාස දෙකේ ආණ්ඩුවේ ප්‍රශ්නයක් නොවූවත් විසඳුම් දිය යුතු වන්නේ ආණ්ඩුව නිසා ආණ්ඩුව ඒ සඳහාද පෙර සූදානම් විය. ලූණු ප්‍රශ්නයද එලෙසමය. රට වටේම මහ මුහුද තිබුණද ලේවාය ආශ්‍රිත ප්‍රදේශයේ කාලගුණ වෙනස්කම ලූණු නිෂ්පාදනයට සෘජුව බලපාන සාධකයකි. ඒ නිසා අද ලූණුත් රජය රටින් ගෙන්නවා යැයි කෑ මොර දෙන විපක්ෂය ප්‍රමාණවත් ලූණු තොග ගබඩා කර නොගැනීම නිසා ලූණු යම්කිසි ප්‍රමාණයක් රටින් ගෙන්වීමට සිදුවිය.

පැවති පෝලිම් යුගයට සාපේක්ෂව භාණ්ඩ මිල පහළ යාම හාල්, ලූණු, පොල් ප්‍රශ්නය සමාජ මාධ්‍යවල ප්‍රධානම මාතෘකා වීම නිසා යටපත් වුවද එම මිල අඩුවීමේ සාපේක්ෂ වාසිය ජනතාවට භුක්ති විඳීමට අවස්ථාව ඕනෑතරම් ලැබී ඇත. සතොස මගින් අලෙවි කරන භාණ්ඩ 30කින් 20ක්ම පැවති රනිල් වික්‍රමසිංහ පාලනයට වඩා මිල අඩු වුවද එය නොපෙනී ගියේ හාල්, පොල් වෙනුවෙන් ලියවුණු 'දුක් ගී' නිසාවෙනි.

> විපක්ෂය අතිමහත් බලාපොරොත්තු තබා තිබූ පරිදි ආණ්ඩුව කරගන්න බැරුව වැටුණේ නැත. දැන් ආණ්ඩුව දේශපාලනයේ බලය මෙන්ම ආර්ථිකය හැසිරවීමේ සුක්කානම නිවැරදි ලෙස අත්පත්කර ගෙන ඇත.

## අපනයනය ආර්ථිකයට ජවයක්!

ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදනය ඩොලර් බිලියන 84කි. එයින් ඩොලර් බිලියන 32කට පැවති රජයන් රට ණය කළේය. 2024 වන විට රජයේ අපනයන ආදායම ඩොලර් බිලියන 16.1කි. ඒක පුද්ගල අපනයනය වසරකට ඩොලර් 732ක් පමණි. (දළ දේශීය නිෂ්පාදනයේ අපනයන ප්‍රතිශතය 19.6% කි). ශ්‍රී ලංකාවට පහළින් සිටි මැලේසියාව, ඉන්දුනීසියාව, තායිලන්තය, දකුණු කොරියාව, පිලිපීනය වැනි රටවල් ලංකාව පසුකර වේගයෙන් ඉදිරියට ගියේ එම රටවල් පාලනය කළේ නායකයින් එම රටවල අපනයන ආර්ථිකයන් දියුණු කළ නිසාය. ලංකාව පාලනය කළ නායකයෝ ලංකාව එම රටවල කුණු බක්කිය බවට පත් කළහ; ඉන්දියාවට, චීනයට සහ ඉහත රටවලට යුරෝපයට, ඇමරිකාවට විකිණිය නොහැකි ඉවතලන භාණ්ඩ විකුණන රට බවට ලංකාව පත් කළහ.

77 වන නිදහස් දිනයෙන් යළි උපත ලබන රටට දැන් ප්‍රධාන අභියෝගය වන්නේ පැරැණි පාලකයින් කසළ ගොඩක් කරන ලද මේ රට 2030 වන විට ඩොලර් බිලියන 36ක අපනයන ආර්ථිකයක් බවට පත්කිරීමයි. ඒ සඳහා අගය එකතු කළ අලුත් නිෂ්පාදන ලෝකයට ඉදිරිපත් කිරීමෙන් ලෝක වෙළඳපොළේ ලාංකේය පංගුව අත්පත් අත්පත්කර ගැනීමත් අප හමුවේ ඇති අභියෝගයයි. ඒ අභියෝගය ජයගන්නා ප්‍රමාණයට (අප ණයගැතිභාවයෙන් නිදහස් වන ප්‍රමාණයට) අප ආර්ථික නිදහසද අත්පත් කර ගනු ඇත. අයවැය දිශානතිය යොමු කර ඇත්තේ ඒ සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශය යොමු කිරීම වෙනුවෙනි. ධීවර, කෘෂි හා කාර්මික අංශ මෙන්ම, රැකියා විරහිත තරුණ ප්‍රජාවද ඒ සඳහා යොමුකිරීමට නව රජයේ පළමු අයවැය දිරිදෙනු ඇත.

ඉතිහාසය ලියන්නේ මිනිසුන් වුවද එය මිනිසුන්ගේ කැමැත්තට පමණක් ලියැවෙනු නොලැබේ. පවතින යථාර්ථය තුළ මිනිසුන් සාමූහික ක්‍රියාකාරීත්වය විසින් ඉතිහාසය ගොඩනගනු ඇත. අතීතය වෙනස් කර අනාගතය සුබදායක කිරීමේ අභියෝගය ජනතාව අප වෙත පවරා ඇත්තේ ඒ වෙනුවෙනි.



අප පොදි ගසා ගන්නා බඩු බාහිරාදිය කෙතරම් වුවද අපි මරණයත් සමග ඒවා අතහැර යන්නෙමු. එහෙත් ඒ සමග අප ඉතිරි කර යන්නේ විනාශ වූ පරිසරයක්, ඉහළම ධනවතුන්ට පමණක් ප්‍රතිලාභ සලසන්නා වූ ආර්ථිකයක් සහ යහපතට එරෙහි කෑදරකම බලගන්වන්නා වූ උරුමයකි. නව මාවතක් අනුගමනය කිරීම සඳහා කැපවීමට දැන් කාලය පැමිණ තිබේ.

**ජෝන් පර්කින්ස්**



# ගෙදරින්, පටන් ගනිමු!

වර්තමාන ආණ්ඩුව බලයට පත් වුයේ පාර්ලිමේන්තුව Clean කිරීමට ඔවුනට ජනවරමක් ලබා දෙන ලෙස ඉල්ලමිනි. එයින් ඔවුන් අදහස් කළේ දියවන්නාව පිරිසිදු කර පාර්ලිමේන්තුවේ ගොඩනැගිලි පිළිසකර කිරීම වැනි පටු දෙයක් නොවේ. මෙතෙක් කලක් රටේ පැවති ජරාජීර්ණ වූ දේශපාලන සංස්කෘතිය වෙනස් කර නව දේශපාලන සංස්කෘතියක් රට තුළ ඇති කිරීමයි.

පසුගිය ජනවාරි පළමුවෙනිදා ජනාධිපති අනුර දිසානායක සහෝදරයා විසින් Clean Srilanka වැඩසටහන පිළිබඳව අදහස සමාජයට ඉදිරිපත් කළ දිනට පසුදාම පරාජයට පත් වූ එහෙත් මුළුමණින්ම විනාශ නොවූ ආණ්ඩුවට එරෙහි බලවේග තම උපරිම බලය යොදා ගනිමින් මෙම වැඩසටහනේ අරමුණ විකෘති කරන්නට විය. මෙය ඉතා සිල්ලර වැඩක් බව සමාජයේ තහවුරු කිරීමට ඔවුන් විසින් නොයෙකුත් උපහැරණ ගෙනෙන ලදී.

මෙවන් වැඩපිළිවෙළක් මෙරට තුළ දියත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව මදක් අවධානය යොමු කළ යුතුය. අප විසිවැනි සියවස අහිමි කර ගත් ජාතියක් ලෙස හැඳින්වීම වරදක් නැත. ලෝකය සාමාජීය, සංස්කෘතික හා ආර්ථිකමය වශයෙන් පිම් ගණනින් ඉහළට එසවෙද්දී අපි ලිං පතුල තුළ කිටි කිටියේ තද වී සිටියෙමු. එයින් ගොඩ ඒම සඳහා රජය විසින් ප්‍රධාන ප්‍රවේශයන් තුනක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබේ. ග්‍රාමීය දිළිදුකම පිටු දැකීම, ඩිජිටල් ආර්ථිකය සහ Clean Srilanka ඒවා වේ.

මෙහිදී අප අවධාරණය කරනු ලබන්නේ **Clean Srilanka** වැඩපිළිවෙළ සම්බන්ධවයි. රජයෙන් කොතරම් තීන්දු තීරණ ගනු ලැබුවත් රටේ ජනතාව ලෙස එම තීන්දු තීරණ හා එක පෙළට සිටගන්නේ නැත්නම් එම තීන්දු සයිබර් අවකාශයේ හෝ කඩදාසි කොළ තුළ පමණක් පවතිනු ඇත.

ඔබ ඔබේ නිවස දෙස බලන්න. එය ප්‍රමාණයෙන් කුඩාද විශාලද යන්න හෝ එහි නිමාව කුමක්ද යන්න හෝ නොව ඒ තුළ සිදුවන ක්‍රියාවලිය පිළිබඳ විමසිලිවත්ව බලන්න. සැබවින්ම අපි අපේ නිවෙස් තුළ ජීවත්වන්නේ කෙසේදැයි නිවී සැනසිල්ලේ කල්පනා කර බලන විට අපට අප ගැනම කණගාටුවක් ඇතිවනු නොවැළැක්විය හැකිය. එයට හේතුව කුමක්ද?

අපේ බොහෝ නිවාස කුණු නිපදවන කර්මාන්තශාලා සහ ඒවා රැස් කර ගන්නා ගබඩා බවට පත් වී ඇත. ෂොපින් බෑග්, ප්ලාස්ටික්, දිරාපත් නොවන ද්‍රව්‍ය ඒ අතර ප්‍රමුඛ වේ.

එපමණක් නොව පවුලේ සාමාජිකයින් සමඟ එක් වී දිනකට එක් වේලක් හෝ ආහාර ගැනීමට අවකාශයක් සැලසී නැත. එයට හේතුව අප ඒ තරමටම කාර්යබහුල වී ඇති නිසාවෙනි. ආහාරයට ගැනීමට සිදුව ඇත්තේ පෝෂ්‍ය ගුණය කෙසේ වෙතත් ක්ෂණිකව සකසා ගත හැකි ආහාර පානය. තවද රාත්‍රී නිවසට පැමිණ පසු රූපවාහිනිය නැරඹීම හෝ ජංගම දුරකථනය වෙත දෑස් යොමාගෙන සිටීම හෝ හැරුණු විට එකිනෙකා තමන්ටම ආවේණික වූ කාර්යන්හි නියැලෙනවා හැර පවුලක් ලෙස සතුටු සාමීචියේ යෙදෙන්නටත්, පවුලක් ලෙස සහයෝගයෙන් වැඩ කරන්නටත්, නිවසේ කාර්යයන් බෙදා හදාගෙන කරන්නටත් හැකි වන පරිසරයක් නිර්මාණය නොවේ. නිවස තුළම අප එකිනෙකා හුදෙකලාවී ඇති සමාජයක් නිර්මාණය වී තිබේ. මෙසේ මානව සබඳතා බිඳ වැටීම මෙන්ම ආකල්පවලින්ද දුර්වල වීම තුළ දෙමව්පියන් සහ දරුවන් අතරද, සැමියන් සහ බිරියන් අතරද ඇතිවන ගැටුම් කෙළවර වන්නේ එක්කෝ සිය දිවි නසා ගැනීමකින් හෝ දික්කසාද වීම් තුළිනි.

මෙසේ පවුල් තුළ ඇති වන ගැටලු අප මත පැටවූ ඒවා මිස අප විසින්ම පමණක් නිර්මාණය කර ගත් දේවල් නොවේ. මෙතෙක් කලක් අප පාලනය කළ දේශපාලන අධිකාරිය විසින් අප මත පැටවූ දේවල්ය. අධ්‍යාපනය රැකියාව හා අනෙකුත් භෞතික සම්පත් ළඟා කර ගැනීම වෙනුවෙන් තනි තනිව අනවරත තරගයක යෙදෙන්නට අපට බල කරනු ලැබ තිබුණි. අනෙකාට වඩා සෑම අතින්ම උසස් ජීවිතයක් තමන්ට ඇතිකර ගැනීමට නිරතුරුවම උත්සාහ දරන මිනිසුන් පැවති පාලනයන් විසින් අපට නිර්මාණය කර දී තිබේ. මෙවැනි ආත්මාර්ථකාමී චින්තනයක් සහිත මිනිසුන් බිහිවීම තුළින් අවසානයේ අපට උරුම කර දී ඇත්තේ කුමක්ද? මාර්ග අනතුරු, ස්වභාවික විපත් ,පරිසර දූෂණය, බෝ නොවන රෝග, වන විනාශය නාස්ති හා දූෂණය පිරුණු රටකි. එකිනෙකා සමග හිනාවෙන්නට පවා නොදත් ලේ සිදුණු මුහුණු ඇති මිනිසුන් පිරුණු රටකි. මෙවන් වට පිටාවක් තුළ මේ තත්වය අතික්‍රමණය කිරීම සඳහා රජය දියත් කළ ප්‍රවේශ මාර්ගයක් වන Clean Srilanka වැඩපිළිවෙළ සක්‍රීය ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා අප මැදිහත් විය යුතුය.

සැබැවින්ම මෙය ආරම්භ කළ යුත්තේ පවුල තුළිනි. පවුල තුළ ප්‍රධාන භූමිකාව වන්නේ ගැහැනු අපයි. මවක්, බිරිඳක්, සහෝදරියක් ලෙස මෙම වැඩපිළිවෙලේ අතිමහත් කොටසක් අපට හිමිව තිබේ. නිවස තුළ සම්පත් නාස්තිය අවම කර ගැනීම, පොදු කටයුතුවලදී නිවසේ සියලු දෙනා වි එක් වී සාමූහිකව තීන්දු තීරණ ගැනීම තුළින් එකිනෙකා කෙරෙහි ගෞරවයක් මෙන්ම සහසම්බන්ධතාවයන්ද නැවත වාරයක් ගොඩනැගෙනු ඇත. එකිනෙකාට ආදරය කිරීම වැනි පවුල තුළ ඇති මානව සබඳතා වඩාත් ශක්තිමත් වනු ඇත, අසල්වැසියා කෙරෙහිද සහකම්පනය ඇති කර ගැනීමට එය පූර්වාදර්ශයක් වනු ඇත. පරිසරය පිළිබඳ උනන්දුව ඇතිකර ගනිමින් පාරිසරික පොදු රීතීන්වලට අවනත වෙමින් සහ සමාජයේ පවතින නීති රීතිවලට ගරුකරමින් නීතිගරුක පුරවැසියෙකු බිහිවීම පවුල තුළින් ආරම්භ කරමු. අප සෑම විටම මේ රට ගොඩනැගීමේ ක්‍රියාවලිය සඳහා පවුල තුළින් ආදර්ශයක් සැපයීම කළ යුතුය. ඒ නිසා Clean Srilanka වැඩසටහන සඳහා අපේ පවුලේ දායකත්වය ලබාගැනීමේ වගකීම ගැහැනුන් වන අප විසින් අපේ උර මත පවරා ගනිමු. පිරිසිදු නිවසක්, පිරිසිදු පවුලක්,පිරිසිදු සමාජමය පුරවැසියෙක් ගොඩනැගීම වෙනුවෙන් අපේ කොටස ඉටුකිරීමට පෙළගැසෙමු.

## කාන්තා ව්‍යවසායකයින්ට හොඳ ඉඩක් නිර්මාණය **කළ යුතුයි!**



**ඔෂානි උමංගා**
**පාර්ලිමේන්තු මන්ත්‍රිනී**

"කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව අවස්ථා ඉහළ නැංවීම සඳහා ඔවුනට අවශ්‍ය බැංකු හා මූල්‍ය පහසුකම් ආදිය ලබාදීමට ආණ්ඩුවක් විදියට අපි කටයුතු කරගෙන යනවා. ඒ වගේම කාන්තා සමිති සඳහා වී මෝල් 100කට අධික ප්‍රමාණයක් ලබා දීම මේ වෙනකොටත් සිදුවෙමින පවතිනවා. මෙසේ කාන්තාවන් කර්මාන්ත ක්ෂේත්‍රයට යොමු කිරීමට අපි ඉලක්ක සහගතව කටයුතු කරමින් ඉන්නවා. ඒ වගේම තාක්ෂණය සහ නවෝත්පාදනයන් සමඟ කාර්යක්ෂමව හා ගුණාත්මකව භාණ්ඩ නිෂ්පාදනය තුළින් දේශීය ව්‍යවසායකයන්ට ලෝක වෙළඳපොලේ තරගකාරීත්වය ජයගැනීමට දිරි දීමට අපි ආණ්ඩුවක් විදයට සැලසුම් කරමින් සිටිනවා. මේ තත්වය තුල කාන්තා ව්‍යවසායකයින්ට හොඳ ඉඩක් විවර වන බව පැහැදිලිව පෙනෙන්නට තිබෙනවා."

## ජන මතය!

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විසින් 2025 නව වසරේ වැඩ කටයුතු ආරම්භ කිරීම නිමිති කොටගෙන කෙටි සැමරුමක් පැවැත්වුණි. මෙහිදී අමාත්‍යාංශ ලේකම්තුමිය ඇතුළු නිලධාරීන් විසින් සූදානම් කර තිබූ තේ පැන් සංග්‍රහයට එක්වූ අමාත්‍යතුමිය ඇතුළු පිරිස සුහද කතාබහක නිරත විය.





ජනවාරි 27 දින ශ්‍රී ලංකා ඉස්ලාම් ආගමික විද්වතුන්ගේ සභාවේ (**All Ceylon Jamiyyathul Ulama**) නියෝජිත හමුවක් කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේදී පැවැත්වුණි.
මේ සඳහා කාන්තා හා ළමා කටයුතු පිළිබඳ අමාත්‍ය සරෝජා සාවිත්‍රි පෝල්රාජ් මහත්මිය සහ නියෝජ්‍ය අමාත්‍ය වෛද්‍ය නාමල් සුදර්ශන මහතාද සහභාගි වූ අතර ශුද්ධ වූ අල් කුරානයේ සිංහල පරිවර්තනය ඇතුළු ග්‍රන්ථ කිහිපයක්ද එහිදී පිළිගන්වනු ලැබුණි.





රටේ කුමන ස්ථානයක, කුමන තත්වයක, කුමන සමාජ ස්ථරයකට අයත්ව සිටියද දරුවන් යනු මෙලොව වටිනාම සම්පතයි. "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" යනු මෙරට සෑම දරුවෙකුගෙම අයිතියයි. 2025 නව වසර උදාවේදීම එවන් මල් කැකුළු පිරිසක් වෙත නව වසරට සුබ පැතුම්ද
රැගෙන අමාත්‍යතුමිය, නියෝජ්‍ය අමාත්‍ය හා නිලධාරීන් කණ්ඩායම වැලිකඩ බන්ධනාගාරය වෙත.



# Gangs of New York

## ශිෂ්ටාචාරයට මුහුණුවරක් නැත



"ආත්ම ලාභය නොතකා වැඩ කිරීමෙන් තොරව, සෑම සියලු පුද්ගලයෙක්ම දරන යෝධ ප්‍රයත්නයක් නොමැතිව, ජීවිතය නව රටාවකට ගොඩනැංවීම සඳහා දැඩි බවක් සහ අධිෂ්ඨානයක් දක්වන්නේ නැතිව, සියලුම කම්කරුවන්ගේ සහ සියලුම දුප්පත් ගොවියන්ගේ දැඩි සංවිධාන වීමක් සහ සහෝදරාත්මක විනයක් නොමැතිව, මේ සියල්ල නොමැතිව ගැලවීමේ මඟක් නොමැත."

**ලෙනින්**

**තෝරාගත් කෘති**

**5 වන වෙළුම**

**141 පිටුව**

"මගේ තාත්තා කියනවා ජීවිතය උපදින්නේ රුධිරයෙන් හා වේදනාවෙන් කියලා. අපි මෙහෙ හිටියා කියන එක හැමෝටම අමතක වෙලා යාවි. ඒත් නගරය හැමදාම පවතීවි" ඇම්ස්ටර්ඩෑම් වැලෝන්ගේ මේ ප්‍රකාශය ඒ දවස්වල නිව්යෝර්ක් නගරය ගැනත්, වර්තමානයේ ශිෂ්ටාචාරවත් වූ නිව්යෝර්ක් නගරය ගැන සංසන්දනාත්මක අදහසක් ලබා දෙයි.

එදා නිව්යෝර්ක් නගරය යනු මැර කල්ලිවල තෝතැන්නකි.

නිව්යෝර්ක් නගරයේ සමස්ත පුරවැසියෝ කල්ලිවලට බෙදී වෙන්ව සිටියහ. ඒ කල්ලි ජාතිවාදීව බෙදී සිටියහ; ආගම්වාදීව බෙදී සිටියහ; ප්‍රදේශීයවාදීව බෙදී සිටියහ; දේශපාලනිකව බෙදී සිටියහ; මේ කල්ලි අන් කිසිවක් නැතත් හොර, මැර, තක්කඩි වශයෙන් කණ්ඩායම්වලට බෙදී සිටියහ. අපට මේ සිනමාපටයේ දී මුණගැසෙන ප්‍රධාන චරිතද්වය නො එසේනම් වීරයින් දෙදෙනාම මෙසේ කල්ලි දෙකක මැර දෙටුවන්ය.

රටක් ශිෂ්චාරවත් වීමට, නො එසේ නම් ශිෂ්ටාචාරයට නීතිය අත්‍යවශ්‍ය බවට හඳුනාගෙන ශිෂ්ට ලෝකයට නීතිය හඳුන්වා දෙන ලද්දේ ග්‍රීසියේ සොක්‍රටීස් නම් දාර්ශනිකයා විසිනි. නීතිය සම්බන්ධයෙන් අදහස් දක්වමින් සියල්ලට ඉහළින් නීතියේ ආධිපත්‍යය පිහිටවිය යුතු බව සොක්‍රටීස් විසින් අවධාරණය කර ඇත. ලෝකයට නීතිය හඳුන්වා දුන් සොක්‍රටීස්ගේ ජීවිතයත්, නීතිය විසින්ම තීරණය කිරීම එක්තරා ආකාරයකට උත්ප්‍රාසයකි. සොක්‍රටීස්ට සමකාලීනව ඇතැන්ස් නගරයට පැමිණෙන දාර්ශනික සංචාරකයෙක් ලෙස ඇනාකාසිස් හඳුනාගත ගත හැකිය. ඔහුගේ විශේෂත්වය වන්නේ, නීතිය තදින්ම විවේචනය කිරීමයි. වර්තමානයේදී පවා නීතියේ ආධිපත්‍යය සම්බන්ධයෙන් යොදා ගන්නා සුප්‍රසිද්ධ කියමනක් වන පහත ප්‍රකාශය ඇනාකාසිස් විසින් කළ බවට පිළිගැනීමක් ඇත.

"නීතිය කියන්නේ මකුළුදැලක්. ඒකට අහුවෙන්නේ පුංචි මැස්සෝ විතරයි. ලොකු සත්තු ඒක කඩාගෙන යනවා. ලිඛිත නීතිය ගත්තත් මකුළු දැලක්ම තමයි. ඒකට නිතරම අහු වෙන්නේ දුර්වලයින් හා දිළින්දෝ විතරයි. පොහොසත් හා බලවත් උදවිය කොහොමටත් ඒක සුනු විසුනු කරලා දානවා."

අප ජීවත්වන වර්තමාන, ශිෂ්ටාචාරවත් යැයි හඳුන්වනු ලබන සමාජයන්හි නීතිය යන කොතරම් උත්ප්‍රාසාත්මක, කොතරම් හාස්‍යජනක මෙවලමක්ද යන්න අත්දැකීමෙන් පසක් කරගෙන සිටින අප එදා නිව්යෝර්ක් නගරයේ නීතිය ක්‍රියාත්මක වූ ආකාරය සම්බන්ධයෙන් කුකුසක් ඇති කරගත යුතු නැත. එය ජැක් ලන්ඩන් සිය 'වනපෙත අඬගසයි' කෘතියේ සඳහන් කළ පරිදි අවියේ හා මුගුරේ නීතිය ක්‍රියාත්මක වූ සමාජයකි.

රටක් ශිෂ්ටාචාරගත කිරීමේදී මුහුණ දෙන බරපතළ අභියෝග යක් වන්නේද මෙම ස්වභාවයයි. අඛණ්ඩවම දිගු කලක් තිස්සේ නීතියේ ආධිපත්‍යපයෙන් බැහැරව තිබුණු රටක, ශිෂ්ටාචාරවත් වීම් සම්බන්ධ කතාබහද සංකීර්ණ වූවකි. එය විවිධ අර්ථකථන පැන නංවන අතර පළමුව ශිෂ්ට විය යුතු පිරිස අනෙකා බවට නිරන්තරයෙන් සංවාද කරති. කලෙක අප රට ජාතිවාදීන් විසින් ව්‍යාපාරික ස්ථාන ගිනිතබා විනාශ කරද්දී, ඉන් පුද්ගලයන්ට මෙන්ම රටටද විශාල වටිනාකමක් සහිත ධනයක් අහිමි කරද්දීත් නීතිය මන්දගාමීව ක්‍රියාත්මක වූ රටකි. යුක්තිය පසිඳලීමේ වගකීම පැවරුණු උසාවි ඉදිරිපිට, විභාග වූ නඩුවලට අදාළව විවිධ ප්‍රකාශ මාධ්‍යවලට දෙමින්, උසාවියට අපහාස කරද්දීත් කිසිවක් කර කියා ගත නොහැකිවූ නීති පද්ධතියක් පැවැති රටක ජීවත් වූ අප වර්තමානයේ, වඩා ඉක්මනින් පියවර ගත යුත්තේ වඩාත් බරපතළ නඩුවලට බවට මතවාද වපුරමින් සිටිමු. ලොකු කුඩා භේදයකින් තොරව රටේ සමස්ත පුරවැසියන්ම නීතියේ විධානය පිළිගන්නා පිරිසක් බවට පත්කිරීම අතිශය අසීරු ව්‍යායාමයකි.

නීතියේ ආධිපත්‍යය ස්ථාපනය යනු සරල ක්‍රියාවක් නොවේ. නුදුරු අතීතයේදී, එකම ක්‍රියාවලියක් වුවද, නීතිය විවිධ පාලක කණ්ඩායම් අත විවිධාකාරයෙන් බල පැවැත්වූ බව නොරහසකි. පොල් ගෙඩි පහක් සොරකම් කළ දැරියකට දැඩි දඬුවම් පමුණුවන බව තොරතුරුක් පලකරන ජනමාධ්‍ය, බරපතළ මූල්‍ය වංචා කළ අයෙකු අත්අඩංගුවට ගෙන, උසාවියට ඉදිරිපත් කිරීමේදී එය බරපතළ ලෙස ප්‍රශ්න කරති. ආගමික සංකේත පද්ධතියක් විවේචනය කරමින් කෙටිකතාවක් ලියූ නිර්මාණකරුවෙකුට ඇප ලබා දීම දිගින් දිගටම ප්‍රතික්ෂේප වෙද්දී, බරපතළ වැරදි කළ පිරිසකගේ නඩු කටයුතු තාක්ෂණික දෝෂ හේතුවෙන් ඉවතට විසි කෙරේ. රටේ නීතිය සැමට සමාන බවට පිළිගැනීමක් ඇත. යමෙකුට එරෙහිව චෝදනා ගොනු කරද්දී, ගොනු කරන චෝදනාවන්ගේ බරපතළ බව හා සරල බව වෙනස් වුවද, අනුගමනය කරනුයේ සාක්ෂි ආඥා පනතේ සඳහන් එකම ක්‍රමවේදයකි. පළමුව විමර්ශනයක් සිදුකළ යුතුය. අනතුරුව, අදාල චූදිතයා අත්අඩංගුවට ගැනීමට ප්‍රමාණවත් තරම් සාක්ෂි ඇති බවට උසාවියට කරුණු ඉදිරිපත් කළ යුතුය. අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ දී අදාළ සැකකරුට ඊට පාදක වූ හේතු පැහැදිලි කළ යුතුය. එහිදී, අයුතු අත්අඩංගුවට ගැනීමෙන් හා ක්‍රෑර වදහිංසාවලට ලක්වීමෙන් වැළකී සිටීමට අදාළ සැකකරුට අයිතියක් ඇති බව නීතියේ සඳහන්ව ඇත. මේ සියල්ල පොත්වල තිබියෙදී, අත්අඩංගුවේ සිටියදී සැකකරුවෝ මිය යති. ක්‍රෑර වධහිංසවලට ලක්වෙති; ඝාතනයට ලක්වෙති. රටක ලිඛිත නීතියක් තිබූ පමණික් රටවල් යහපත් වන්නේ නැත. ඒ සඳහා නීතිය අභිබවා යන ආකාරයට ශිෂ්ටත්වය ගොඩ නැගී, සමාජ වටපිටාව යහපත්ව ප්‍රතිනිර්මාණය විය යුතුය. එදා නිව්යෝර්ක් නගරය මුහුණ පා සිටි අභියෝගය වන්නේ එයයි.

වැලිකඩ බන්ධනාගාර බිත්තියේ ලොකු කළු අකුරෙන් ලියා ඇති වැකියක "සිරකරුවෝද මනුෂ්‍යයෝය" යන යෙදුම හමුවේ. එකී වැකිය විස්තීරණය කරමින් පොලිසියද මනුෂ්‍යයෝය; සාක්කිකරුවෝද මනුෂ්‍යයෝය; නීතීඥයෝද මනුෂ්‍යයෝය; විනිසුරෝද මනුෂ්‍යයෝය; බන්ධනාගාර නිලධාරීහුද මනුෂ්‍යයෝය ආදී වශයෙන් මෙම සංකල්පය වඩාත් සංකීර්ණ කළ හැකිය. පොදුවේ සමාජයේ සියලුම දෙනා තුළ ඇති දුර්වලතා එකී මනුෂ්‍යයන් තුළද නො අඩුව දක්නට ලැබේ. කිසියම් සමාජයක වෙසෙන මිනිසුන් තුළ බොහෝ අඩු ලුහුඬුකම් පවතින්නේ නම්, ඉහත කී මනුෂ්‍යයින් තුළද සාමාන්‍ය ප්‍රමාණයට වඩා ඉහළ ප්‍රතිශතයක අඩුපාඩු පවතී. එය උසස් සමාජ තත්වයක් බවට පත්කිරීමට නම්, මෙකී මනුෂ්‍යයින් තුළ පවතින අඩුපාඩු අඩු කළ යුතුය. එසේ මනුෂ්‍යයා තුළ පොදුවේ පවතින අඩුපාඩු, පිළිගත් සම්මතයන්ට අනුව අඩු සමාජයක් වඩා ශිෂ්ට සමාජයක් ලෙස හඳුනාගත හැකිය.

නැවතත් අපගේ අවධානය නිව්යෝර්ක් නගරයට යොමු කරමු. ඡන්දය යනු කොතරම් බලගතු ප්‍රජාතන්ත්‍රවාදී මෙවලමක්ද යන්න අත්දැකීමෙන් ප්‍රත්‍යක්ෂ කරගත් අප රටේ පුරවැසියන්ට සමාන පිරිසක් මෑත කාලීන ලෝක ඉතිහාසයෙන් හමු නොවේ. එහෙත් පැවැති ක්‍රමය එවැන්නක් නොවේ. විශේෂයෙන්ම එදා නිව්යෝර්ක් නගරයේ පැවැති ක්‍රමය මීට හාත්පසින්ම වෙනස් වූවකි. එදා පැවැති මැතිවරණයට සිය ඡන්දය භාවිත කිරීමට අනපේක්ෂිත පරිදි විශාල පිරිසක් පැමිණීම නොඉවසන නගරාධිපතිවරයාගේ මේ ප්‍රකාශය, තුන්කල්හිම පාලකයින් මහජන කැමැත්ත ගැන කල්පනා කළ ආකාරය විදහා පෙන්වන කැඩපතක් වැනිය. නිව්යෝර්ක් ඡන්දයට අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඡන්දදායකයෝ සහභාගි වෙති. ඒ හේතුවෙන්ම ඡන්ද පත්‍රිකා ප්‍රමාණය අවසන් වෙයි. ඒ බව අසා නගරාධිපතිවරයා මෙසේ පවසයි.

"ඡන්දේ පළවෙනි නීතිය මතක තියා ගන්නවා. ඡන්ද පත්‍රිකා නෙවෙයි ප්‍රතිඵල දෙන්නේ. ඡන්ද ගණන් කරන අය තමයි ප්‍රතිඵල දෙන්නේ. ඡන්ද පත්‍රිකා නැතත් දිගටම ගණන් කරන්න කියන්න"

ලංකාවේ පළමු විධායක ජනාධිපතිවරයා සම්බන්ධයෙන් මෙම සිදුවීමට සමාන ලෙසට පැතිරුණු ප්‍රවාදයක් ඇත. ප්‍රවාද යනු නිතරම සාවද්‍ය හෝ ප්‍රබන්ධමය කරුණු නොවේ. බොහෝ ප්‍රවාදයන් සත්‍ය වේ. අප රට වැනි රටවල ප්‍රවාදයන් සත්‍යයට වඩා අඩු වන අවස්ථා බහුලය. රටක පාලකයා දැඩි මර්දනකාරී ඒකාධිපතියෙක් නම්, ඔහු/ඇය සම්බන්ධයෙන් හෙළිදරව් වන බොහෝ කරුණු ප්‍රවාදයන් වන අතර හෙළිදරව් නොවූ සත්‍ය කරුණුද රැසක් ඇති බව අප විසින් සිහි තබා ගත යුතුය. මෙරට සිටි එක් විධායක ජනාධිපතිවරයෙකු යමෙකුට තර්ජනය කිරීමට අවශ්‍ය වූ අවස්ථාවල ජනාධිපති මන්දිරයට කැඳවා, කාමරයකට කැඳවාගෙන ගොස්, හුදකලා කර අතින් පයින් පහර දුන් බවත්, එසේ කර, කාමරයෙන් එළියට එද්දී කරට අත දමාගෙන සිනාසෙමින් පැමිණෙන බවටත් ප්‍රවාදයක් ඇත. ඡන්දය හා සම්බන්ධ ප්‍රවාදයෙන් කියවෙන්නේ එක්තරා අතුරු මැතිවරණයකදී අදාළ ජනාධිපතිවරයාගේ පක්ෂය පරාජය වුණු බවයි. දිසාපතිවරයා, තේරීම් භාර නිලධාරියා ලෙස එම තත්වය ජනාධිපතිවරයාට දැනුම් දී ඇති අතර ඒ සඳහා ජනාධිපතිවරයාගේ ප්‍රතිචාරය වී තිබුණේ "එහෙම නම් දිනනකම් ගණන් කරන්න!" යන්න බවට එකී ප්‍රවාදයේ සඳහන්ය. මේ සම්බන්ධයෙන් බොහෝ දෙනෙකුගේ මතය වන්නේ ඒකාධිපතියන් ආත්මයෙන් ආත්මය උපදින්නේ නැති බවය. ඒ වෙනුවට, බොහෝ පාලකයින් සිය නොහැකියාව නිසාම, ඒකාධිපතියන් බවට පත්වෙන බවය.

කාගේ වරදින් හෝ වේවා මිනිසෙක් ඝාතනය වීමෙන් අනතුරුව ශෝකය පළ කර, ඒ පුද්ගලයා පිළිබඳ මතකය අවසන් කර දැමීම අශිෂ්ට සමාජයක ගති ස්වභාවයයි. මෙවන් වූ මනුෂ්‍ය ස්වභාවයක් ගැන ඇම්ටර්ඩෑම් වැලෝන් මෙසේ පවසයි.

"අන්තිමට අපේ මිතුරන් වෙනුවෙන් ඉටිපන්දම් පත්තු කරාවි. අපට වියදම් නැත්තම් රජයේ වියදමින් ඒක කරාවි"

ඇවිළ යන මහා යුද්ධයේදී නායකයින් ආරක්ෂා වෙද්දී පක්ෂ විපක්ෂ සතුරෝ හා මිතුරෝ සමසමව ඝාතනය වෙති. මිය යන සියල්ලෝම එක් සොහොනක වල දමනු ලැබෙති. ඒ දෙස බලා කෙනෙක් මෙසේ පවසයි.

"අන්තිමට සතුරන් හා මිතුරන් අතර කිසිම වෙනසක් නෑ"

මෙවන් වූ සමාජයක් ශිෂ්ටාචාරවත් කිරීමට නම්, එය මුළුමනින්ම විනාශ කර දමා, නවතම සමාජයක් ගොඩනැගිය යුතු විය. මේ නගරයේ ප්‍රධාන මැරයා නො එසේ නම් දුෂ්ටයා වූ බිල් ද බුචර් එක් අන්තයක වීරයෙක් වන අතර ඔහුගේ ප්‍රධාන අභියෝගකරුගේ පුතා අනෙක් අන්තයේ වීරයෙක් විය. මේ ප්‍රධාන වීරයන්ට අමතරව බොහෝ කල්ලිවල නායකයෝ, ඒ ඒ බල ප්‍රදේශ තුළ වීරයෝ වූහ. ඉහත දෙබස් කණ්ඩයේ සතුරන් හෝ මිතුරන් කිසිවෙක් නැතැයි ප්‍රකාශ කළද, ප්‍රේක්ෂකයා පවා මේ වීරයින් දෙදෙනාගෙන් එක් පැත්තක සිටින බව රහසක් නොවේ.

සෑම සිනමා නිර්මාණයක් අවසානයේදීම දුෂ්ටයා පරදා වීරයා ජය ගනී. මෙම සිනමා නිර්මාණයේ අවසානයද එවැන්නක් වෙනු ඇති බව අපගේ විශ්වාසයයි. පීඩාවට ලක් වූ මිනිසා කෙරෙහි අනුකම්පාවෙන් හා සංවේගයෙන් ඔහුගේ පළිගැනීම සාධාරණීකරණය කරන අපි අනෙක් පසින් ඊට පෙර පැවැති බිහිසුණු සංස්කෘතිය වෙනස් කළ මිනිසා වීරයෙක් සේ සැලකීමට පෙළඹෙමු. ඇම්ටර්ඩෑම් වැලෝන් ජයග්‍රහණය කිරීමට පක්ෂ ප්‍රේක්ෂකයා,

11 වැනි පිටුවට



> දෙවියන් විසින් ලෝකයේ බලය-ආධිපත්‍යය දැරූ සමයේ යහපත හා අයහපත දෙස බලා සිටියේ දෙවියන්ය. දැන් අප බුද්ධිවාදය තුළ දෙවියන් මරා දමා ඇත. එවන් පසුබිමක, ඉහළ සිට බලා සිටින්නට දෙවියෙක් නොමැති බැවින්, ඉහළ සිට බලා සිටිනා දෙවියන් බවට "නීතිය" පත්ව ඇත. වර්තමාන ශිෂ්ට සමාජය නිර්මාණය කිරීමට දෙවියන්ට වඩා නීතියට විශාල වගකීමක් පැවරී ඇත.

# පොලිටිකල් පංතිය

දිග නිවාඩුවකට පස්සෙ කට්ටිය ආපහු පංතියෙදි එකතුවෙලා එක ගෝසාවයි. හැමෝටම කියන්න දේවල් තිබුණා. ලංකාවෙ දේශපාලනේ ඉඳලා ඇමරිකාවෙ දේශපාලනේට යනකනුයි ලංකාවෙ රිලවුන්ගෙ ඉඳලා කැලිෆෝනියාවෙ ලැව් ගිනි වෙනකනුයි කතාවලින් පංතිය පිරිලා. හැමෝම තම තමන්ගේ කතාබතාවල හින්ද පොලිටික්ක පංතියට ඇවිල්ල අතින් මේසෙට ගහනකම් කාටවත් නිනව්වක් තිබ්බෙ නෑ.

"මොකද්ද ළමයිනේ මේ ගාලගෝට්ටිය. මොනාද ඔච්චර කියවන්නෙ?" පොලික්ක පංතිය නිහඬ කරන්න හදනවා.

"අයියෝ... සර් ඇවිල්ලනෙ. අපි දැක්කෙත් නෑ" මේසෙට ගහනව ඇහුණු එක්කෙනා එක්කෙනා ඉස්සරහට හැරෙන්න පටන් ගත්තම ගෝසාව තුනී වෙලා ගියා.

"සර් මොකද ඇදිලා ගිහිල්ලා", "සනීප නැතුව හිටියද?", " වයසටත් ගිහින් වගේ", "පාරකදි හම්බවුණොත් නෑ. සර් කොහේ හරි ගිහිල්ල හිටියද?" ඒ ගමන හැමෝගෙම වගේ ප්‍රශ්න පොලිටික්ක පැත්තට හැරුණා.

"නෑ නෑ මට මොනවත් වෙලා නෑ... කොහේවත් ගියේ නෑ. ගෙදරම තමයි හිටියෙ" පොලිටික්ක ආරක්ෂක පියවරකට පසුබැහැලා උත්තර බැන්දා.

"ඇයි සර් ගෙයින් එළියට බහින්න බැරි තත්වයක් ආවද?... ඒත් ඡන්දෙන් පස්සෙ කාටවත් කරදක් වුණේ නෑනෙ... සර් මොකටද හැංගිලා හිටියෙ" ප්‍රශ්න පත්තරයක් එන්න ගත්තා. ගෙදරම හිටපු එක හංගිලා හිටියා කියන තත්වෙට ගියා.

"ඇයි... ඇයි... මම හැංගෙන්නෙ. මම වැරදි වැඩක් කළේ නෑනෙ" පොලිටික්කට මල පනින්නත් වගේ.

"නෑ... නෑ... සර් කියාගෙන ගියපු ඒවත් එක්ක අපි හිතුවෙ ඡන්දෙන් පස්සෙ බයට හැංගුණා කියලා" කට කෑවත් කමක් නෑ කියල මංජුව යෝකර් එකක් දැම්ම.

"මොනවද මං කියාගෙන ගියේ... මං වැරදි දෙයක් කිවුවද?" පොලිටික්ක බංකරෙන් එළියට පැනලා නිරාවරණය වුණා.

"නෑ සර්... ලොකු දෙයක් කිවුවෙ නෑ. හාමුදුරුවරුන්ට දානෙ හම්බ වෙන්නෙ නැති වෙයි, පෝයට සිල් ගන්න බැරි වෙයි. පෙරහැර කරන්න බැරිවෙයි. පන්සල් යන එක තහනම් කරාවි. හාමුදුරුවරු කුඹුරු වැඩට දාවි කිවුවා. ව්‍යාපාර පවරගන්නවා කිවුවා. ගෙවල් ගිනි...." කනියට කියාගෙන යන්න හම්බ වුණේ නැහැ.

"හෝව් හෝව්" පොලිටික්ක අත දාලා ඉස්සරහට පැන්නෙ එක්ස්ප්‍රස් බස් එකක් නවත්තන්න වගේ. "කවුද කියන්නෙ ඕවා මම කියපු දේවල් කියලා?"

"සර්ම කිවුවා කියන්නෙ නෑ... සරුත් තැන් තැන්වල ඕවා කිවුවනෙ නේද?" මංජුව බේරෙන්න දෙන්නෙම නෑ.

"මම කිවුවෙ අර පඩත්තර නාලිකාවල එක එකා කියපු දේවල් මිසක් මගෙ දේවල් නෙමෙයිනෙ. මාව අල්ල ගන්න එපා" පොලිටික්ක බුද්ධිමය දේපළ නීතියට ආවරණය වුණා.

"එතකොට අර සර් කිවුවෙ ආර්ථිකේ කඩා වැටෙනවා. කොටස් වෙළඳපොළ වැටෙනවා... බොරුනම් මේන් මගෙ කණ කියලා" අනුරුද්දියත් හීනියට කෙනිත්තුව.

"මං එහෙම කිවුවද? මට මතක නෑ" පොලිටික්ක දුමින්ද තියරිය දැම්ම.

"සර් එහෙම කිවුව මටත් මතකයි" කනියත් කණවැල ඇල්ලුව.

"හරි... මම කිවුවම කියමුකො... ඒක බොරු වුණා... ඉතින් මම කිවුවෙ මේන් මගෙ කණ කියලනෙ. ඔය තියෙන්නෙ" පොලිටික්ක හිනා වුණා තනියම.

"හරි කලින් ඒවා අමතක කරන්නකො. දැන් ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන ගැන සර් මොකද කියන්නෙ?" සමන පොලිටික්කගෙ කණ වෙන්දේසියෙ දාන්න කලින් කතාව අදට ගෙනාවා.

"ඕක නං හරියන් නෑ... මේ රටේ ඉන්නෙ ආත්මාර්ථකාමී මිනිස්සු. ඒ මිනිස්සුත් එක්ක මොනවත් ක්ලීන් කරන්න බෑ" පොලිටික්ක බැරි බැරියාව පටන් ගත්තා.

"දිය රකුස්ගේ 'චව් චව්' ගෝලයා වගේ 'ඕක නං හරියන් නෑ...' කියන්න එපා සර්. මේ රටේ මිනිස්සු ලොකු තීරණයක් අරගෙන තමයි, මේ ආණ්ඩු වෙනස කළේ. ඒ මිනිස්සු තමන්ට පෞද්ගලිකව ලැබෙන දේ ගැන විතරක් හිතුවනම් තාමත් දෙන දෙයක් කාලා වෙන දෙයක් බලාගෙන ඉන්නවා. මේ වැඩේ ඉස්සරහට යනකොට, මිනිස්සු වැඩේ තේරුම දැනගන්නකොට වැඩේ තමන්ගෙ අතට අරගෙන යනවා. ඒ වැඩි දෙනෙකුට ඕනෙ මේ රට ගොඩයන්න මිසක් තමන් තනියම ගොඩයන්න නෙමෙයි. රට ගොඩගියොත් තමනුත් ගොඩයනව කියල එයාල දන්නව" පොලිටික්කගෙ පෙන්නපු කණ රතු වෙන අතරෙ සමන කියල දැම්ම.

## කවුළුව හැරමි තබමි

# 1948 පෙබරවාරි 04 සහ 2025 පෙබරවාරි 04



1948 පෙබරවාරි 04 වන තෙක් කොළඹ නගරය කේන්ද්‍ර කරගෙන සකස් වී තිබුණු සුදු පාලන යන්ත්‍රය එතෙක් මෙහෙවමින් සිටි පිරිස ඒ වන විටත් එම රාජ්‍ය යාන්ත්‍රණය පවත්වාගෙන යාමට යම් යම් ප්‍රමාණයට හවුල් වී සිටි ස්වදේශික පුත්‍රයන් යැයි කියාගත් පිරිසකට 1948 පෙබරවාරි 04 දින පවරා දෙනු ලැබිණි. මේ පැවරීමට අදාළ නෛතික පසුබිම සකස් කෙරුණේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුළ සම්මත කෙරුණු පනතක් මගිනි. ඊට හේතුව 1948 පෙබරවාරි 04ට පෙර මේ දූපතේ කොළඹ කේන්ද්‍රීය පාලන තන්ත්‍රය එහි දේශපාලන හා නෛතික සුජාතභාවය ලැබුවේ බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුව තුළින් වීමය. ඒ වගේම මෙම පාලන තන්ත්‍රය මෙහෙයවූ ඉහළම ධුරලාභීන් ඍජුවම පත් කෙරුනේද බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවෙනි. මෙම සිද්ධි දාමයේ අවසන් ඵලයට අපේ රටේ බොහෝ අය අපිට නිදහස ලැබුණා යැයි ව්‍යවහාර කරති. එහෙත් මෙය සැබෑ නිදහස නොවේයැයි කියූ පිරිස් එදත් හිටියේය; අදත් සිටිති.

නමුත් මෙවර නිදහස් දිනය සමරන විට අපිට නම්, එහි ලොකු විශේෂත්වයක් තිබේ. එසේ වන්නේ මෙතෙක් 'තමන්ගේ නිදහස' සැමරූ දක්ෂිණාංශික ප්‍රතිගාමී පාලන තන්ත්‍රයකින් මිදී එය පැවැත්වීමට අවකාශ විවර වීමයි. මෙතෙක් කල් 'නිදහස' යනුවෙන් මේ රටේ අය හැඳින්වූයේ රටේ මිනිසුන්ගේ ජීවිත වෙනස් කළ සංකල්පයකට නොවේ. උත්සවශ්‍රීයෙන්, ආචාර සමාචාර මැද අර ප්‍රභූ යැයි කියන පාලක කණ්ඩායම සමරපු ප්‍රබන්ධයක් පමණය. නිදහස තිබුණේ ඔවුන්ගේ ඔළු ඇතුලේ සහ ජීවිත ඇතුලේ පමණය.

'පොහොසත් රටක් ලස්සන ජීවිතයක්' යන්න තේමාව කර ගනිමින් මේ රට දැන් පාලනය කරන ජාතික ජන බලවේගයේ ආණ්ඩුව මේ වන විටත් නව පුනරුද යුගයකට අදාළ සැලසුම එළමින් තිබේ. එය මේ සමාජයේ මිනිසුන්ගේ ජීවිත වෙනස් කරන නව නිදහස් ගමනක ආරම්භය බව අපි තරයේ විශ්වාස කරමු. මේ පෙබරවාරිය රටට, අපිට විශේෂ වන්නේ ඒ නිසාය.

# Clean Sri Lanka and Dirty People



ගෝලීය ශ්‍රී ලංකා යනු කුණු කානු ශුද්ධ කරන ව්‍යාපෘතියක් නොවේ. පළමුව එය ලාංකේය සමාජයේ ජීවත් වන පිරිමින් සහ ගැහැනුන්ගේ මොළ ශුද්ධ පවිත්‍ර කරන දැවැන්ත සමාජ ව්‍යාපෘතියකි. එය මේ සමාජයේ මිනිසුන්ගේ චින්තන රටාව වෙනස් කරන ඔවුන්ට භෞතිකව සහ ආධ්‍යාත්මිකව ඉහළට ඔසවා තබන දැවැන්ත පෙරළිකාර ව්‍යාපෘතියකි. එහෙත් අතලොස්සක් වූ මේ රටේ Dirty මිනිස්සු එයට උසුළු විසුළු කරමින් එය කාණු ශුද්ධ කිරීමකට, බස්වල කැලි ගැලවීමකට ලඝු කර එම දැවැන්ත හා පුළුල් ව්‍යාපෘතිය හැල්ලු කිරීමට නිතරම මාන බලති. විශේෂයෙන් සමහර විරුද්ධවාදී දේශපාලුවන් සමහර පෞද්ගලික රූපවාහිනී, ගුවන් විදුලි නාලිකා හා සමහර සමාජ නිල නාලිකාවල උදවිය ඒ සඳහා පෙරමුණ ගෙන සිටිති.

දිනපතා මොහොතින් මොහොත මේ රටේ ජනයාගේ මොළ තුළට කුණු විෂබීජ ඇතුල් කරන ඉහත කිළිටි මිනිස්සු, මේ ආණ්ඩුව කරන ජනතාවාදී වැඩවලට නිරන්තරයෙන්ම අකුල් හෙළමින් සිටිති. 'ක්ලීන් ශ්‍රී ලංකා' ව්‍යාපෘතිය ගැන කිසිම අධ්‍යයනයක් නොකර, කියවීමක් නොකර, කටට එන එන බොරු ඇදබාමින් රටේ ජනයාගේ ඔළු කිළිටි කිරීම ඔවුන් දැන් තම, ප්‍රමුඛතම කාර්යභාරය කරගෙන සිටිති. කිසිවක් කර කියාගත නොහැකිව, ජනතාවගෙන් ප්‍රතික්ෂේප වී අනාථ වී, අන්ධභූතභාවයට පත්වී සිටින මේ අපිරිසිදු මිනිසුන්ගෙන් ඊට වඩා දෙයක් අපේක්ෂා කිරීම අපි මොළේ කළඳක් නැති මෝඩයන්ට භාරදමු. අර ඉතාලි ජාතික ශ්‍රේෂ්ඨ කිවිවර ඩාන්ටේ වරක් කවි බසින් කීවාසේ "ඔබ තෝරාගත් මඟෙහි නොසැලී ගමන් කරන්න. හිස් මිනිසුන් ඕන දෙයක් කියාපු දෙන්" කියා අපි මේ සටහනට තිත තබමු.

# ඕං - සාටක - නාටක

"රාජපක්ෂවරුන්ගෙන් පළිගන්න ගිහිල්ලා මේ ආණ්ඩුව ඇන ගන්නවෝ, පොලීසිය නා ගන්නවෝ, මේ ආණ්ඩුවට අපිත් එක්ක හැප්පෙන්න බැරියෝ."

මේ රාජපක්ෂ පවුලේ කොලු කුරුට්ටන්ගේ සහ ඔවුන්ගේ බත්බැලයන්ගේ මේ දිනවල උදාන පාඨයයි. යම් පරීක්ෂණයක් සඳහා රාජපක්ෂවරයෙකු අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් බාරයේ තබා පසුව ඇප මත නිදහස් කළ විට රාජපක්ෂවාදීන් ඒකට කියන්නේ 'නිදොස් කොට නිදහස් කළාය' කියාය.

රාජපක්ෂ පාලනය මේ රටට කළ අහස පොළව නුහුලන විනැහිය මුළු රටම දනී. ඔවුන්ව පසුගිය මැතිවරණයෙන් සියයට දෙකහමාරේ කුල්ල කුජීත තත්වයට මේ රටේ ජනයා විසින් පත් කළේ ඒ නිසාය. "රෙද්ද රෙවුණත් කටේ නරිවාදන් අඩු නැහැ" කීවාසේ දැන් රාජපක්ෂ බේබිලා රටට සාටක නාටක පෙන්වමින් උඩුබුරමින් සිටිති. මේ නැටුම් මේ ගැයුම් අවසන් වන දිනය අත ළඟය. ඇපමත නිදහස් වුනාට නඩු විභාග දිගටම යයි. වස්කා නමැති බළලා ඇහුම්කන් දෙයි. ඒත් දිගටම කාගෙන කරයි. මේ ආණ්ඩුව නඩු විභාග ගෙන යන්නේත් එලෙසය.

ඇපත් නැතිව පැරදුණු රාජපක්ෂ හොර නඩයට ඇපත් නැතිව හිරේ ළගින්න වෙන දිනය වැඩි ඈතක නොවේ. බූරුවෙක් කේෂර නාදය කරන්න ගොස් හොඳටම කළේ ගොන් කතාවක් අපි කුඩා කළ අසා ඇත්තෙමු. "සිල්රෙද්ද පොරවා ගත්තද අපරාධකාරයෙක්ට පාපයෙන් ගැලවී යා නොහැක." "ගොනා පසුපස ඇදී එන රිය සකසේ" අපරාධවල සාපය හඹා එන්නේ නුඹලා පසුපසය.



2025 ජනවාරි 22

# Clean Sri Lanka කියන්නේ ජනතා අභිලාෂයට අප දුන් නමයි

*(ක්ලීන් ශ්‍රී ලංකා වැඩපිළිවෙල පිළිබඳ දෙදින විවාදයේ පිළිතුරු කථාව කරමින්)*

මම විවාදය අවසන් කිරීම සඳහා පිළිතුරු කථාව මෙතැනින් පටන් ගන්න කැමැතියි. සමගි ජන බලවේගය කියන පක්ෂය සහාය දෙන්නේ රාජපක්ෂ රෙජිමයටද, රනිල් වික්‍රමසිංහ රෙජිමයටද, නැත්නම් මේ පුන පුනා කියන Clean Sri Lanka වැඩපිළිවෙළටද? මොකද සජබය මේ දවස්වල රනිල් වික්‍රමසිංහ මැතිතුමා සමග එකතු වෙන්න සාකච්ඡා කරනවා. ඒ රනිල් වික්‍රමසිංහ කරපු දේශපාලන, ආර්ථික අපරාධ නිසා තමයි, මේ රටේ ජනතාව රනිල්වත් ගෙදර යවලා - හෝදලා යවලා - අප ඉල්ලන්නේ නැතුවත් මන්ත්‍රීවරුන් 159 දෙනෙකු එවලා තිබෙන්නේ. දිනන බව දැනගෙන හිටියට අපි එච්චර ඉල්ලුවේ නැහැ. ඔබතුමන්ලා දැන් ඒ අපරාධකාර, මේ රට විනාශ කරපු ඒ රනිල්ගේ රෙජිමයත් එක්ක කරන සාකච්ඡාව මොකක්ද? එසේ සාකච්ඡා කරන ගමන් මෙතැනට ඇවිල්ලා Clean Sri Lanka වැඩසටහනට සහයෝගය දෙනවා කියන්නේ මොකක්ද? ඔබතුමන්ලාගේ කථා එකතු කරලා ඒ කථාවල text එක වෙන වෙනම columns දෙකකට දාලා බලන්න. මේ text එකට විරුද්ධයි ඊළඟ text එක. මා කියන්නේ භාෂාව පිළිබඳ විශේෂඥ ඥානය තිබෙන කෙනෙකු ලවා ඒක deconstruct කරලා බලන්න කියලයි. ඒවායේ කිසිම පදනමක් නැහැ. ඔබතුමන්ලා රාජපක්ෂලාත් එක්කත් ඉන්නවා.

ඔබතුමන්ලා දන්නවා, මේ රටේ මහ ජනතාව අපට ජනවරමක් දීලා තිබෙන බව. රජපක්ෂලා -ඒ රෙජිමය- මේ රටේ මහජන මුදල් අසීමාන්තිකව මංකොල්ල කෑවා කියන එක ඔබතුමන්ලා දන්නවා. ලංකාවේ ප්‍රධාන මන්දිර තුනම අදත් පාවිච්චි කරන්නේ කවුද, රාජපක්ෂලා. අදත් ජනාධිපති ආරක්ෂකයන් වැඩි ප්‍රමාණයක් ඉන්නේ කාටද?

කොළඹ තිබෙන ප්‍රධාන මන්දිර සියල්ලේම ඉන්නේ ජනාධිපති ආරක්ෂකයන් සහ රාජපක්ෂලා. රුපියල් කෝටි 45ක කාපට් ආදී අනම් මනම් ගෙනාවා, යෝෂිත රාජපක්ෂගේ SMSවලින්. එහෙම විනාශයන් කරපු රාජපක්ෂගේ ගෙදරට එක්කෝ, රුපියල් ලක්ෂ 46ක කුලිය දෙන්න ඕනෑ. අපි ඉතා smart විධියට කටයුතු කරලා තිබෙන්නේ. එක්කෝ කුලිය දෙන්න. එහෙම නැත්නම් රුපියල් 30,000 අරගෙන යන්න. මේ රටේ දුප්පත් මිනිස්සුන්ගේ අම්මලා තාත්තලා බලාග න්නේ කවුද? ඇයි, දුප්පත් මිනිස්සු, සාමාන්‍ය ජනතාව, සිවිල් සේවකයන්, හමුදාවේ අය, පොලීසියේ අය, සාමාන්‍ය ගුරුවරු රටට සේවයක් කරන්නේ නැද්ද? හිටපු ජනාධිපතිවරු විතරද රටට සේවය කරන්නේ? විපක්ෂයේ කිහිපදෙනෙක්ම අද කථා කළා රාජපක්ෂලා ගෙදරින් එළියට ඇදලා දානවා කියලා. මම මේ සජබෙට කියන්නේ. පොහොට්ටුවේ කවුරුවත් මෙතැන ඉන්නවාද? මම හිතන්නේ නැහැ කියලා. හැඳි ගෑවෙන්න යැව්වානේ.

ඔබතුමන්ලා හිතන්නේ වංචාව, වංචනික බව කියන වචන ජනතාවට තේරෙන්නේ නැහැ කියලාද? මිනිස්සුන්ට වචන තේරෙනවා; body langnage එක තේරෙනවා; හැඟීම් තේරෙනවා. ඒ නිසා මේ දේශපාලනය තුළ ඔබතුමන්ලාට කවදාවත් මේ රටේ ජනතාව දිනාගන්න බැහැ. මිනිස්සු පෙන්වපු මාවතක් තිබෙනවා. මේ රටේ ජනතාව සදාචාර බලයක් ගොඩනගලා තිබෙන්නේ. කාටවත් හෙළවෙන්න බැහැ. අපට පවා හෙළවෙන්න බැහැ. ඒක moral power එකක්. ඒක politcal social විතරක් නොවෙයි. moral power එකක්. අපට පවා සිද්ධ වුණා අවනත වෙන්න. අපි මෙතරම් විනය ගරුකව, මෙතරම් සදාචාරසම්පන්නව ඇත්ත ජීවිතයේදීත් කටයුතු කරනවා. අපි රඟපානවා නොවෙයි. ඔබතුමන්ලා හිතනවාද, ඔබන්තුමන්ලා රාජපක්ෂලා එක්ක, රනිල් එක්ක එකට හිටගන්න ගමන්, රාජපක්ෂලා ගෙවල්වලින් එළියට ඇදලා දානවා කියලා මෙතැන කිවුවාට රටේ ජනතාව ඔබතුමන්ලා අනුමත කරනවා කියලා? sorry. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජබය කියන්න ඕනෑ කාටද සහාය දෙන්නේ කියන එක. රනිල්ටද, මහින්ද රාජපක්ෂටද, නැත්නම් ජනතාවටද? ඒක නොකිවුවා කියලා අපට ප්‍රශ්නයක් නැහැ.

> ඔබතුමන්ලා හිතන්නේ වංචාව, වංචනික බව කියන වචන ජනතාවට තේරෙන්නේ නැහැ කියලාද? මිනිස්සුන්ට වචන තේරෙනවා; body langnage එක තේරෙනවා; හැඟීම් තේරෙනවා. ඒ නිසා මේ දේශපාලනය තුළ ඔබතුමන්ලාට කවදාවත් මේ රටේ ජනතාව දිනාගන්න බැහැ.

ඒක එතුමන්ලාගේ දෙයක්.

Singaporeවල, USAවල, Chinaවල මේ වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කර තිබෙනවා. ලෝකයේ හැම රටක්ම නිදහස් අරගලවලින් ඉස්සරහට එනකොට ඒ විධියට



ප්‍රවාහන, මහාමාර්ග, වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍ය

**බිමල් රත්නායක සහෝදරයා**

තමයි කටයුතු කරන්නේ. 1948 ඉඳලා බලන්න. දෙවැනි ලෝක යුද්ධයෙන් පස්සේ රටවල් නිදහස් වෙනකොට හැම රටකම මේ වාගේ ව්‍යාපෘති සිය ගණනක් කරලා තිබෙනවා.

සමහරු හිතාගෙන ඉන්නේ මේක ශ්‍රමදාන project එකක් කියලා. එහෙම කියලා මේක mock කරනවා. මම දන්නේ නැහැ මේක හදපු අය සිංගප්පූරුවේ දේවල් අධ්‍යයනය කළාද, නැත්නම් ඇලස්කාවේ දේවල් අධ්‍යයනය කළාද කියලා. එහෙම කළාට ප්‍රශ්නයකුත් නැහැ. නමුත්, මගේ පක්ෂය වෙනුවෙන් මම දන්න දේ මේකයි. මේක අපි කණ්ඩායමක් වශයෙන් කරපු දෙයක්; ජනාධිපතිතුමා වැඩිපුර උනන්දුවෙන් කරපු දෙයක්. මේ රට පුනරුද ව්‍යාපාරයකින් ඉස්සරහට එනකොට, සිංගප්පූරුවල අත්දැකීම් ගත්තත් නැතත්, මේක automatically එන දෙයක්.

මේ රටේ මිනිසුන්ට මේ රට හදා ගන්න ඕනෑ නිසා අපට ඡන්දය දුන්නේ. අපි කළේ ඒ අභිලාෂයට නමක් දැමීම පමණයි. මේක සිංගප්පූරුවෙන් ගත්තා නොවෙයි. මේක, සිංගප්පූරුවල කොපියක් කියනවා. අපට ඒවා තේරෙන්නේ නැහැ. අපි බබාලා! මම අහන්න කැමැතියි. "Clean Singapore" Project එක කියවපු කෙනෙක් මෙතැන ඉන්නවාද කියලා. Singapore ගැන USA ගැන ගොඩක් දේවල් කිවුවා. ඒවා මෙතැන ඉන්න එක්කෙනෙක්වත් කියවලා තිබෙනවාද? අද එක්කෙනෙක් කිවුවා, "ට්‍රම්ප් ජනාධිපතිතුමාගෙන් ඉගෙන ගන්න. එතුමා එක පෑන් පහරින් කළා" කියලා. මූලාසනරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දන්නවා. American Law එක වෙනස්. ට්‍රම්ප් ජනාධිපතිතුමා ඡන්දෙ දිනුවේ, 2024 නොවැම්බර් 05වැනි දා. එතුමා වැඩ භාර ගත්තේ දිනලා දින 75කට පස්සේ මේ ජනවාරි 21වැනි දා. USA Constitution එක අනුව transition period එකක් තිබෙනවා. ඒ transition period එක තුළ තමන්ගේ team එක නම් කරනවා. ඊළඟ විදේශ ඇමති, ඊළඟ රාජ්‍ය ලේකම්, ඊළඟ Health Director වාගේ ඔක්කෝම පත් කරනවා. ඒ team එක දවස් 75ක් වැඩ කරනවා. කොහොමද බලය මාරු කර ගන්නේ කියලා. ඒ ඔක්කොම homework කරලා දවස් 75කට පස්සේ තමයි ට්‍රම්ප් ඇවිල්ලා, 75වෙනි දවසේ දිවුරුම් දුන්නේ. දැන් මේ සභාවට ඇවිල්ල කියනවා, අනුර දිසානායකට ඉගෙන ගන්නලු ට්‍රම්ප්ගෙන්! ඔයගොල්ලන් ට්‍රම්ප් කරේ තියා ගත්තාට අපට ප්‍රශ්නයක් නැහැ. ට්‍රම්ප් දවස් 75ට කරපු වැඩවලට වඩා අනුර දිසානායක දවස් 63ට කරලා තියෙනවා.

## ජනවරමේ වැදගත්ම...

03 පිටුවෙන්

නව දේශපාලන සංස්කෘතියක් ගොඩනගන්න දරන ප්‍රයත්නයට විරුද්ධ වෙමින් තාවකාලික දේශපාලන වාසියක් ලබා තිබෙනවා. ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට එරෙහිව කිසිම බයකින් තොරව ක්‍රියාකිරීමේ වාසියක් ලබාගෙන තිබෙනවා. ඒක ඉතාමත්ම තාවකාලිකයි. ධන බලය තිබුණත් ඉදිරියේදී ඔවුන් බිංදුවට වැටෙනවා. මෙතෙක් කාලයක් ආණ්ඩු බලය ගත් පිරිස් ප්‍රජාතන්ත්‍ර විරෝධීව ක්‍රියාකර සහ පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සිදුකිරීමෙන් විපක්ෂය විශාල වශයෙන් බිඳවැට්ටුවා. එවැනි තත්වයන් අවසන් කිරීමේ සංස්කෘතියක් අපි ගොඩනගමින් සිටින අතර, කුජීතම වුණු කණ්ඩායම් තමන් තවමත් ශක්තිමත් බව පෙන්වන්න උත්සාහ කරනවා. ඒ නිසාම ඔවුන් සමුපකාර කිහිපයක ඡන්ද ජාතික ජන බලවේගය පැරදුණු බව කියන්න විශාල උත්සාහයක් දරනවා. ඒ වගේම වරායෙන් කන්ටේනර් නිදහස් කිරීමේ ප්‍රමාදය විශාල ප්‍රචාරයකට යොදා ගන්න උත්සාහ කළත්, දැන් පච වී තිබෙනවා.

ජාතික ජන බලවේගය ආණ්ඩුවේ ආරම්භක ක්‍රියාකාරිත්වය හමුවේම රනිල් වික්‍රමසිංහ, මහින්ද රාජපක්ෂ, සජිත් ප්‍රේමදාස එකතු වෙන්න උත්සාහ කරනවා. එකතු වෙන්න හදන්නේ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග, හොරු ඇල්ලීම වෙනුවෙන් ජනතාවාදී පාලනයක් ගෙන යන 2/3ක ජනවරමක් තිබෙන ආණ්ඩුවට විරුද්ධවයි. ඒ නිසාම ඔවුන් තවදුරටත් පිරිහෙනවා. කෙටි කාලයක් ඔවුන් මේ දැඟලිල්ල කරයි. මේ ජනවරම තේරුම් අරගෙන ක්‍රියාකරන විපක්ෂයක් අපට අවශ්‍යයි. අපට වඩා ඉහළ ජනතාවාදී ගුණාංග නැතිව මාධ්‍ය බලය සහ දූෂිත මුදල් බලය යොදාගෙන දඟලන දැඟලිල්ල අපට අභියෝගයක් නොවෙයි.

## ශිෂ්ටාචාරයට මුහුණුවරක්...

09 පිටුවෙන්

පළිගැනීම සාධාරණ බවට කරුණු දක්වයි. බිල් ද බුචර්ගේ ජයග්‍රහණය පතන ප්‍රේක්ෂකයා ශක්තිය හා බලපෑම මත නගරය ගොඩ නැංවීම වරදක් නැතැයි විශ්වාස කරයි. මේ දෙපිරිසම, ඉන් ඔබ වූ ශිෂ්ටාචාරයක් ගැන කිසිවක් නොදන්නා අඳබාලයෝ බවට නිර්මාණකරු විසින් පත්කෙරේ.

නව ශිෂ්ටාචාරයක්, නව ශිෂ්ටත්වයක් යනු නිසැකවම පැරැණි දේ කඩා බිඳ දමා නව දෙයක් නිර්මාණය කිරීමකි. ඒ කිසිදු නිර්මාණයක් මෘදු මෙහෙයුමකින් ගොඩනංවන්නට නොහැකිය. ඒ වෙනුවෙන් කරන අරගලයේදී සිත් රිදවීම් මෙන්ම ගැටුම් ඇතිවනු සුලබය. කෙසේ වෙතත්, අම්ටර්ඩෑන් වැලෝන් තරයේම විශ්වාස කරනුයේ මෙම ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමෙන් අපට ජයග්‍රහණය ලැබිය හැකි බවයි. ඔහුගේ සිහිනය වඩාත් හොඳ ප්‍රතිසංස්කරණවාදියෙකි.

"හැම අවුරුද්දෙම සංශෝධකයෝ ආවා. හැම අවුරුද්දෙම තත්වය එන්න එන්නම නරක අතට හැරුණා. හරියට නරක තත්වයට පත්වෙන්න ගොඩක් කැමැත්තෙන් ඉන්නවා වගේ"

පවත්නා තත්වය නිර්මාණය කරන ලද්දේ දේශපාලනයෙන් නම්, එය වෙනස් කළ යුත්තේද දේශපාලනයෙනි. ඇම්ටර්ඩෑම් වැලෝන්ගේ දුර්වලතාව වන්නේ ඔහුගේ දෘෂ්ටිවාදීමය දුර්වලතාවයි. එනම්, ඔහු අදේශපාලනික ප්‍රතිසංස්කරණ තුළින් සමාජය වෙනස් කළ හැකි බවට විශ්වාස කරන්නෙකි; අදේශපාලනික මානවවාදීන් ලෝකය වෙනස් කර, ප්‍රතිනිර්මාණය කරන්නේනේ කෙසේද යන්න සම්බන්ධයෙන් දැක්මක් නැත. නව ලෝකය නිර්මාණය කිරීමට නම් පැරැණි ලෝකය සමග එයට ඇති සියලුම සම්බන්ධතා විනාශ කළ යුතුය. පැරැණි සම්බන්ධතා එවා බිහිකළ ගර්භාෂයත් සමගම, එනම් එම තත්වය පවත්වාගෙන යාම කෙරෙහි ඉවහල් වන තීරණාත්මක දේ සමගම විනාශ කළ යුතුය. මේ අරමුණ ඉටු වීමට නම්, ප්‍රගතිශීලී වීරයා ජයග්‍රහණය කළ යුතුය. මෙහි නිර්මාණකරුට අවශ්‍යම දුෂ්ටයා පරදා වීරයා ජයග්‍රහණය කිරීම නොව, ශිෂ්ටාචාරය ජයග්‍රහණය කරවීමයි.

මෙම චිත්‍රපටය අවසානයේ යුද්ධ නෞකාවක් පැමිණ මේ මැර කණ්ඩායම් දෙකේ අවසන් ජවනිකාව හෙවත් කූඨප්‍රාප්තිය විනාශ කර දමයි. මෙහිදී, වෙඩි තබන ලෙසට නැවට අණ කළ මිනිසා සිනමා කෘතිය තුළ අපට නිරාවරණය නොවේ. එහෙත්, ඔහු ඉතිහාසය වෙනස් කළ මිනිසෙකි. එනම්, ඒබ්‍රහම් ලින්කන්ය. අප නොදුටුවද ලින්කන් නියෝජනය කරන්නේ ප්‍රතිශීලීත්වය බවට ඒ නායකයාගේ, අදටත් තදින්ම අවධානයට ලක් වුනු අදහස්වලින් පෙනී යයි. ඔහු විසින් පහර දී අනීතික කල්ලි කණ්ඩායම් සියල්ල විනාශ කරන අතර අපට නොපෙන්වන මුහුණකට හිමිකම් කියන මිනිසෙක් විසින් නගරයේ ශිෂ්ටාචාරය ගොඩනංවයි.

නූතන ලෝකයේ බලය බුද්ධිවාදය විසින් අත්පත් කරගෙන ඇත. ඒ නිසාම දෙවියන් පලා ගොස් ඇත. ජී.බී. සේනානායක විසින් ලියූ දෙවියන් මැරීම නම් කවියෙන්, නිට්ෂේ විසින් බුද්ධිවාදය මගින් ඉදිරිපත් කළ මෙම මතය සනාථ කර ඇත. ජී.බී. කියන්නේ තමන් දිනක මඟ රැකගෙන සිටි දෙවියන් මරා දැමූ බවත්, එතැන් සිට බුද්ධිය සිය "බර අඩි තබමින් තමා පසු පසු එනු තමාට දැනෙන" බවත් පවසයි. දෙවියන් විසින් ලෝකයේ බලය-ආධිපත්‍යය දැරූ සමයේ යහපත හා අයහපත දෙස බලා සිටියේ දෙවියන්ය. දැන් අප බුද්ධිවාදය තුළ දෙවියන් මරා දමා ඇත. එවන් පසුබිමක, ඉහළ සිට බලා සිටින්නට දෙවියෙක් නොමැති බැවින්, ඉහළ සිට බලා සිටිනා දෙවියන් බවට "නීතිය" පත්ව ඇත. වර්තමාන ශිෂ්ට සමාජය නිර්මාණය කිරීමට දෙවියන්ට වඩා නීතියට විශාල වගකීමක් පැවරී ඇත. ඒ අනුව, ශිෂ්ට ලෝකයෙන් නීතිය අහෝසි කර, අවනීතිකභාවය ස්ථාපනය කිරීමක් යනු, ශිෂ්ට ලෝකයේ දෙවියන් මරා දැමීමකි. අප නීතියේ ආධිපත්‍යය ගැන බෙහෙවින්ම අවධානයෙන් පසු විය යුත්තේ එබැවිනි.

# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com




චීන සංචාරය අතරතුර...



බිඳුණු සිත් යාකරන ගමනක...



තඹුත්තේගම සුහද හමුව අතරතුර...



ස්විට්සර්ලන්තයේ තානාපතිනිය හමුවී...



ඇමරිකා එක්සත් ජනපද තානාපතිනිය සමග...



බ්‍රිතාන්‍ය මහ කොමසාරිස් හමුවී...



ශ්‍රී ලංකාවේ කියුබානු තානාපති සමග...

# ඔවුන් බිරුවාවේ, අපි අපේ මඟ යන්නෙමු

බලය අහිමි වූ දූෂිත පාලකයින් හා ඔවුන්ගේ සහචරයින් නව පාලනයට එරෙහිව අවලාද වපුරමින් සිටියද එම කණ්ඩායම්වලට බිරීමට ඉඩහැර අත්‍යවශ්‍යම විටෙක පැහැදිලි කිරීමක් කරමින් හොඳ ගමනක් යාමට එකතු වන ලෙස ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ආරාධනා කළේය.




ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා

ටිල්වින් සිල්වා සහෝදරයා මේ අදහස් පළ කළේ 'විප්ලවීය ව්‍යවහාරයේ විශ්වීය සළකුණ.. ලෙනින් කියවමු' තේමාව යටතේ පසුගිය ජනවාරි 21 වැනි දින මහවැලි කේන්ද්‍රයේ පැවති 101 වැනි ලෙනින් සමරුවේදීය.

පාර්ලිමේන්තු මැතිවරණයෙන් ආණ්ඩුව පිහිටුවා මාස දෙකක් ගත වෙනවා. ආණ්ඩු බලය යටතේ සමාජය වෙනස් කරන්න පොර බදන අපි හැමෝටම ලෙනින්ගේ ඉගැන්වීම් මේ වෙලාවේ ඉතාම වැදගත් වෙනවා. ආණ්ඩුවට මාස දෙකක් වුණත් අවුරුදු දෙකක පමණ විවේචන එල්ල වී තිබෙනවා. මේ රට බංකොලොත් කර, විනාශය කරා ගෙන ගිය ජනතාවගේ හතුරන් කෝපයට, වියරුවට පත්වී සිටිනවා. ඔවුන් කල්පනා කළ ආකාරයට ආණ්ඩුව අර්බුදයට නොග ිය නිසාත් කලබල වී ඉන්නවා. අපි ආවාට පස්සේ තෙල් පෝලිම් ඇතිවීම, ලයිට් කැපීම, රට බංකොලොත්භාවයට වැටීම, ජාති වාදය ඇතිවීම වගේ මැතිවරණයට ඉස්සෙල්ලා ඔවුන් ගෙනගිය ප්‍රචාර කිසිවක් සිදුනොවන විට කෝපයට පත්වී සිටිනවා. ඒ නිසා පදනමක් නැති අවලාද ගොඩක් එල්ල කරමින් සිටිනවා. මීට කලින් ආණ්ඩු මාරු වුණාම මාස දෙකක් විතර ගතවන තුරු තියෙන්නේ ජයග්‍රහණය සැමරීමේ සංදර්ශන සහ විරුද්ධවාදීන්ගෙන් පළිගැනීමේ ක්‍රියාමාර්ග. දැන් ඒවා මොකක් වත් නැති නිසා ඔවුන් එල්ල කරන විවේචන කොතරම් ප්‍රබලද කියනවා නම්, අපට උදව් කළ සමහර අය පවා මේ ගමන යන්න බැරිවෙයිද කියන අවිනිශ්චිතතාවයට පත්වී සිටිනවා.

මේ වගේ තත්වයන් ගැන ලෙනින් සහෝදරයාගේ තෝරා ගත් කෘති 8 වැනි වෙළුමේ මෙහෙම කියනවා. " සුපුරුදු ධනපති සම්බන්ධකම් පිළිබඳව පැරණි රජ දහන තුළ සිට කටයුතු කිරීම සරලය, පහසුය. නමුත් අලුත් මාවතක යාමට අපට උවමනාවී තිබේ. එම මාර්ගයේ යාම සඳහා අප සහ ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් හා සංවිධානයක් අවශ්‍යය. ඒ සඳහා වැඩි කාලයක් අවශ්‍ය වන අතර එහිදී වඩාත් බරපතළ වැරදි සිදුවේ. නමුත් වැරදි නොකරන්නේ ප්‍රායෝගික වශයෙන් යමක් කිරීමට ප්‍රයත්න නොදරන අය පමණක් බව අපි කියන්නෙමු." මේ ප්‍රකාශය හරිම පැහැදිලියි. පැවති ක්‍රමයම ගෙනයනවා නම්, අපට පහසුයි, සරලයි. එහෙම ගියා නම් රජයේ ආයතනවලට තමන්ගේ නෑදෑයෝ දාගන්නවා; කොන්ත්‍රාත් නෑදෑයන්ට ලබාදෙනවා; කොමිස් ගහනවා; හොඳම වාහන ටික ගන්නවා; ගෙවල් ටික අල්ලා ගන්නවා; විනෝද වෙනවා. පැරණි ක්‍රමයට ගියා නම් සිදුවෙන්නේ ඔය දේවල්. අපිට උදව් කරපු කට්ටියත් සන්තෝෂයෙන් ඉන්නවා. නමුත් අලුත් මාර්ගයකට යාම සඳහා පක්ෂය සහ සියලු ජනතාව කෙරෙහි උසස් මට්ටමක දේශපාලන විඥානයක් වගේම සංවිධාන ශක්තිය වර්ධනය කර ගැනීමත් අවශ්‍යයි.

අපේ ආණ්ඩුවේ ලොකුම වැඩපිළිවෙළ 'ක්ලීන් ශ්‍රී ලංකා' පටන් ගත්තා විතරයි, දැඩි ප්‍රහාර එල්ල කරන්න පටන් ගත්තා. රටක් වෙනස් කරමින් අලුත් මාවතක යන කොට මේ වගේ අභියෝග එනවා. ඒ බව තේරුම් ගන්න දේශපාලන සවිඥානකත්වයකුත් නිවැරදිව ක්‍රියාකරන්න දේශපාලන සංවිධානයකුත් අවශ්‍යයි. මහජන ඡන්දයෙන් බලය ගත්තාම පවතින ව්‍යවස්ථාවට අනුව වැඩකරන්න, නීති රීතිවලට අනුව වැඩකරන්න, පවතින කළමනාකාරිත්වය ඇතුලේ වැඩකරන්න වගේ බැඳීම් ටිකක් තිබෙනවා. ලෙනින්ගේ කාලයට වඩා අපිට ප්‍රශ්නය ටිකක් බැඃරුම් සහ සංකීර්ණයි.

අපි බලය ගන්න කොට ලංකාව ආර්ථික වශයෙන් බංකොලොත් කර තිබුණත් මාස දෙකක් තුළ ඒ තත්වයෙන් මිදුනු රාජ්‍යයක්. ලෝකයේ ආර්ථිකය සම්බන්ධයෙන් කටයුතු කරන ෆිච් රේටින්ස් වගේ ආයතන අපව ඔසවලා තිබෙනවා. අපි ආවාට පස්සේ රුපියල කඩාගෙන වැටෙන්න ඉඩ නොදී, ඩොලරයට සාපේක්ෂව රුපියල තුන්සීයට යටින් තියා ගන්න අපි සමත් වුණා. අපි ආවාම කොටස් වෙළඳපොළ කඩා වැටෙයි කියලා ඒ ගොල්ලෝ කීවත් වැඩිම ක්‍රියාකාරිත්වය වාර්තා කරන්න අපිට හැකිවී තිබෙනවා. සංචාරකයන් මිලියන දෙකක් ගිය අවුරුද්දේ ලංකාවට ආවා. මේ අවුරුද්දේ මිලියන තුනක් කර ගන්න අපි උත්සාහ කරනවා. බිඳ වට්ටා තිබුණු රටක මේ ස්ථාවරත්වය ගොඩගැනීම ජයග්‍රහණයක්. රටේ සම්පත් විකිණීම නතර කර, මුදල් ඉතිරි කර, විදෙස් සංචිත වැඩිකර ගන්න හැකිවී තිබෙනවා. වංචා, දූෂණ පිරුණු රාජ්‍ය පාලනයක් වෙනුවට රාජ්‍ය ආයතනවල නාස්තිය, වංචා-දූෂණ නවත්වා තිබෙනවා ජනාධිපති, ඇමති මණ්ඩලය සහ ආණ්ඩුව මේ වෙනුවෙන් උඩින් ආදර්ශ දී තිබෙනවා. දිවුරුම් දීමේ උත්සව, වැඩ බාර ගැනීමේ උත්සව, නොගත්තා විතරක් නොවෙයි, කිසිම ආයතනයකට ඥාතීන් පත්කර ගත්තේ නැහැ. සරලව කැපවීමෙන් රාජ්‍ය පාලනය කරන හැටි ආදර්ශයෙන් ලබාදී තිබෙනවා.

වංචා-දූෂණ, පගාවන් ගන්නේ නැති ඇමතිවරුන් ඉන්න රටක් හැටියට ගෞරවය දිනාගෙන තිබෙනවා. ඒ නිසාම ජාත්‍යන්තර ආයෝජකයන්ගේ අවධානය විශාල වශයෙන් දිනාගන්න හැකි වුණා. චීනයෙන් ඩොලර් බිලියන 3.7ක ආයෝජන ලැබී තිබෙනවා. රජයට කොතරම් ආර්ථික අමාරුකම් තිබුණත් ජනතාවට විශාල වශයෙන් සහන ලබාදී තිබෙනවා. සහන ලබාදීම ගැන විස්තර විවිධ අවස්ථාවලදී අපි හෙළිකර තිබෙනවා. ඒ අයට විවේචනය කරන්න හේතු ඕනෑ නැහැ. ඕනෑම දෙයක අනෙක් පැත්ත සොයා ගන්න පුළුවන්.

පෙරළු නැවුම් පස පොත කියවන කොට, එදා රුසියාවේ පරාජිත බලවේග ගෙන ගිය ප්‍රචාර ගැන තේරුම් ගන්න පුළුවන්. ගම්වල වැඩිහිටි කාන්තාවන් මොස්කව් නුවරට බලෙන් ගෙනියලා බිත්තර රකින්න තියන බව ප්‍රචාරය කර තිබුණා. ඒ වගේම ෆිදෙල් කැස්ත්‍රොගේ 'මගේ ජීවිතය' කියන පොතේ සඳහන් කර තිබෙනවා, "කියුබාවේ කුඩා දරුවන් එකතු කර, රුසියාවට යවලා මස් කර ටින්වල අසුරා ආපසු කියුබාවට එවන බව ප්‍රචාරය කිරීම නිසා ළමුන් 12000ක් රටෙන් පිටුවහල් කර ඇති බව" සඳහන් වෙනවා. ප්‍රතිගාමී බලවේග මිනිසුන්ව නොමග යවන්නේ ඔය ආකාරයෙන්.

ලෙනින් සහෝදරයා මෙන්න මෙහෙම කියනවා. "මහා පැරණි ගස් කපා හෙළිමේදී වීසිවන හැම අතිරේක අතු කැබැල්ලක් ගැනම බෙලරුසෙව්ගේ පටන් මාතෙව් දක්වාම ධනපති සමාජයේ සුරතල් බල්ලන් කෙඳිරි ගෑවාවේ, බිරුවාවේ, නිර්ධන පංතියේ ඇතා දැක බිරීමට නොවේ නම්, ඒ සුරතල් බල්ලන් සිටින්නේ කුමකටද? ඔවුන් බිරුවාවේ, අපි අපේ මඟ යන්නෙමු" ඕනෑම ලොකු වැඩක් කරන්න ගියාම කුඩා කුඩා අතපසුවීම්, මග හැරීම්, වගේම අඩුපාඩුකම් සිදුවෙන්නත් පුළුවන්. ඒ සම්බන්ධයෙන් රුසියාවේ යොදාගෙන තිබෙන නම් වෙනුවට මේ රටේ අයගේ සමහර අයගේ නම් දාගත්තාම තේරුම් ගන්න පුළුවන්. ඒ වගේම බ්‍රිතාන්‍යයේ හිටපු අගමැති වින්සන්ට් චර්චිල් කීවේ "ඔබ ගමනක් යන විට ඔබට බුරන හැම බල්ලාටම ගල් කැටවලින් ගහන්න නතර වුවහොත් ඔබට ඔබේ ගමන යන්න වෙන්නේ නැත." කියලයි. ඒ ගොල්ලන්ට බුරන්න ඇරලා අත්‍යවශ්‍යම විටෙක පැහැදිලි කිරීමක් කරලා හොඳ ගමනක් අපි යමු.

අපට වගේ නොවෙයි, රුසියාවේ ලෙනින් සහෝදරයාට වැරදීම් ගොඩක් සිදුවුණා. බලය ගත්ත වෙලාවේ අනුගමනය කළ සමහර ප්‍රතිපත්ති නිසා කෘෂිකර්මාන්තය බිඳ වැටිලා සාගතයක් පවා ඇතිවන තත්වයක් ආවා. 1919 නව ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දුන්නේ ඊට පසුවයි. ලෝකයේ සෑම රටක්ම අලුත් දේවල් කරන කොට ඇති වන අඩුපාඩුකම් හදාගෙන ඉස්සරහට යනවා. ලෙනින් පටන් ගත්ත අලුත් ක්‍රියාමාර්ගවලදී ලැබුණු අත්දැකීම් ලියලා අපට ඉතිරි කර තිබෙනවා. මේ අත්දැකීම් හොඳින් කියවා අප අනුගමනය කරන ක්‍රියාමාර්ගවලටත් යොදා ගැනීම මේ අවස්ථාවේ අපගේ වගකීම වී තිබෙනවා.


බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.